## බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

ස්ථානය : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2010.12.30

වේලාව : පෙ.ව.10.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:-**

| | |
|---|---|
| 01. ගරු සභාපති, | ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා |
| 02. ගරු උපසභාපති | සුමේද චාමින්ද බස්නායක මැතිතුමා |
| 03. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.විමලසේන මැතිතුමා |
| 04. ගරු නාගරික මන්ත්‍රී | ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා |
| 05. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා |
| 06. ගරු නාගරික මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා. |
| 07. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම්. රූමි මැතිතුමා |
| 08. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 09. ගරු නාගරික මන්ත්‍රී | යූ.එච්. ගාමිණී මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය:-**

01. ආර්.ඩී.නලින් පුෂ්පකුමාර ලේකම්

(01) **ආගම සිහිකිරිම:**

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(02) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන:**

ගරු සභාපතිතුමා කථාකරමින්, අද දින පවත්වනු ලබන්නේ 2010 වර්ෂයේ අවසාන සභා රැස්වීම වන බවත්, ඒ සඳහා සභා රැස්වීමට සහභාගීවීමට පැමිණ සිටින ගරු උපසභාපතිතුමා මන්ත්‍රීතුමන්ලා ලේකම් මහතා සාදරයෙන් පිළිගන්නා බව පැවසීය.

ගරු සභාපතිතුමා කථාකරමින්, බළන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ සේවය කරන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් 06 දෙනෙකුට බළන්ගොඩ නගර සභා බලප්‍රදේශයට අයත් වසම්වල මහජන සෞඛ්‍යයට අදාල කටයුතු ඉටුකිරීම සඳහා සභාවේ අනුමැතියට හා පාලනයට යටත්ව බලය පවරාදීමේ ලිපි මීට සුළු වේලාවකට ඉහත දී ප්‍රදානය කල බැව් පැවසීය. එමගින් සුවිශේෂි වූ බලය පවරාදීමක් සිදුකර නොමැති බවත් ,නාගරික බල ප්‍රදේශයේ සෞඛ්‍ය ආරක්ෂාව වඩාත් ක්‍රමවත්ව ගුණාත්මක ලබාදෙමින් ජනතාවට සුවදායී සෞඛ්‍ය සේවාවක් සැපයීම අරමුණු කරගනිමින් එම කාර්යය සිදුකල බැව් වැඩිදුරටත් පැහැදිලි කරන ලදී.

2011 වර්ෂයේ අයවැය ලේඛනය සකස් කර ගරු මන්ත්‍රීවරුන් අතට පත්කර ඇති අතර , ඒ තුලින් 2011 වර්ෂයේ දී ඉතා හොඳ සේවයක් ජනතාව වෙත ලබාදීම අපේක්ෂිත යැයි පැවසූ ගරු සභාපතිතුමා, පළාත් පාලන ආයතන වල ධුරකාලය අවසන්ව ඇති නිසා ඉදිරි දින කිහිපය

ඇතුළත පළාත් පාලන ආයතන විසුරුවා හැර ඉදිරියේ දී මැතිවරණයක් පැවැත්වීමට බොහෝ ඉඩ ඇති බවත් ඉදිරි පළාත් පාලන මැතිවරණය මනාප ක්‍රමයට පැවැත්වීමට රජය අදහස් කර ඇති බැව් දැනගැනීමට ඇතැයි ද පවසන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව ජාතික සවිය , ගම නැගුම , මග නැගුම යන වැඩ සටහන් තුළින් ද සභා අරමුදල් හා වෙනත් ආධාර මුදල් උපයෝගී කරගෙන නාගරික ජනතාව වෙනුවෙන් සුවිශාල වූ සේවාවන් රැසක් ඉටුකල බැවින් ඒ සම්බන්ධව අප සියළු දෙනාටම සතුටුවිය හැකි බැව් පැවසීය. බළන්ගොඩ නගරයට විශාල අඩුවක්ව පැවති මහජන පොළ ඉදිකිරීමේ කටයුතු අවසන්ව ඇති බැවින් , එය ඉතා ඉක්මණින් ජනතා අයිතියට පැවරීමට කටයුතු කල යුතුව තිබෙන බවත් , ඒ සම්බන්ධව අද දින ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටින ලදී.

මෙම නගර සභාව වාර්ෂිකව පිරිත් පිංකමක් පවත්නු ලබන බවත් , ඒ අනුව අද දින බළන්ගොඩ තානායමේ දී පරිත්‍රාණ ධර්මදේශනයක් හා පසුදින හීල්දානමය පිංකමක් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති බැවින් , ඒ සඳහා සහභාගීවන ලෙස ගරු මන්ත්‍රීවරුන් සියළු දෙනාටම ආරාධනය කරමින් සභාවේ ඉදිරි වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

(03) **2010..11.25 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව හා 2010.12.22 පැවති විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කිරීම:**

පසුගිය සභා වාර්තාවේ " වසර ගණනාවක් පුරාවට පැවති කුරිරු කොටි ත්‍රස්තවාදය තුරන් කිරීම , සුසාමි ව්‍යසනයට ලක්වීම වැනි අභියෝගයන්ට සාර්ථකව මුහුණ දී රට දැවැන්ත සංවර්ධන ක්‍රියාවලියක් කරා මෙහෙයවමින් රටේ ජනතාවට සහන ලබාදෙමින් , සෑම අංශයක්ම දිරිගන්වමින් , ජනතාවට වඩා දීප්තිමත් අනාගතයක් උදාකිරීම සඳහා ඉදිරිපත් කල අයවැයක් ලෙස සලකනු ලබන බැව් දැන්වීය. " යනුවෙන් සඳහන් ඇති බවත් එය" වසර ගණනාවක් පුරාවට පැවති කුරිරු කොටි ත්‍රස්තවාදය තුරන් කිරීම , සුනාමි ව්‍යසනයට ලක්වීම වැනි අභියෝගයන්ට සාර්ථකව මුහුණ දී රට දැවැන්ත සංවර්ධන ක්‍රියාවලියක් කරා මෙහෙයවමින් රටේ ජනතාවට සහන ලබාදෙමින් , සෑම අංශයක්ම දිරිගන්වමින් , ජනතාවට වඩා දීප්තිමත් අනාගතයක් උදාකිරීම සඳහා ඉදිරිපත් කල අයවැයක් ලෙස සලකනු ලබන බැව් දැන්වීය. " යනුවෙන් සංශෝධනය විය යුතු බැව් ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් පවසන ලදී. එම සංශෝධනයට යටත්ව 2010.11.25 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තා සහ 2010.12.22 වන දින පැවති විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් වාර්තා සභා සම්මත විය.

(04) **පසුගිය සභා වාර්තාවන් සමාලෝචනය කිරීම:**

වාර්තාවන් සමාලෝචනය කිරීම සිදුනොවුණි.

05. **සභාවට ලැබී ඇති ලිපි/පෙත්සම්/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම:**

05:01 **වැකුඹුර මාර්ගයේ පැති බැම්ම සම්බන්ධවයි**

ඉහත සඳහන් කරුණට අදාළව තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතියේ සභාපති විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මෙම දිනවල පවතින අධික වර්ෂාව නිසා ඉහත සඳහන් මාර්ගයේ පැති බැම්ම ජල පීඩනයට හසුව බැම්මේ කොටසක් සම්පූර්ණයෙන්ම ගැලවී ගොස් ඇත. මෙම ව්‍යාපෘතිය 20% ක ශ්‍රමදායකත්වයක් ඇති ව්‍යාපෘතියක් වන අතර , එයට ශ්‍රමදායකත්වය ද ලැබෙන්නේ ඉතා සුළු වශයෙනි. සිදු වූ අලාභය ගණනය කිරීමේ ලක්ෂ 02 ක් පමණ වන අතර , එය සමිතියට දැරිය නොහැකි පාඩුවක් වේ. නැවතත් මෙම ඉදිකිරීම ඒ ආකාරයට සිදුකිරීමෙන් ඵලක් නොවන බැවින් , මීට වඩා තාක්ෂණික උපදෙස් සමිතිය වෙත ලබාදෙන ලෙසත් , මෙම බැම්ම නැවත එම ස්ථානයේ ස්ථාපිත නොකලහොත් එම මාර්ගයටත් , කුඹුරුහිමියන්ටත් , ප්‍රදේශවාසීන්ටත් විශාල ප්‍රශ්නයකට මුහුණදීමට සිදුවන බැවින් මීට ක්‍රියාකාරී ආයතනය වන බළන්ගොඩ නගර සභාවෙන් නැවත මෙම බැම්ම ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුවක් සකස් කරදෙන ලෙස ඉල්ලා තිබිණ.

වැඩ අධිකාරී මගින් ඇස්තමේන්තුවක් සකසා නොපමාවම 2011 වර්ෂයේ දී නැවත එය ඉදිකිරීම සුදුසු බවට සභාව අනුමත කරන ලදී.

### 05:02 **දියණියගේ අධ්‍යාපන කටයුතු සඳහා උපකාරයක් ලබාගැනීම**

උක්ත කරුණට අදාළව මාර්ග කම්කරු, එල්.කේ.හේමචන්ද්‍ර මහතා විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

සිය දියණිය අ.පො.ස.උ/පෙළ විභාගය ඉතා ඉහළින් සමත්ව විශ්ව විද්‍යාලයට තේරීපත්ව ඇත. ඇයගේ අධ්‍යාපන කටයුතු වලට විශාල වියදමක් දැරීමට සිදුව ඇති බැවින් , එය දැරීම අපහසු වන නිසා , ඒ සඳහා යම් උපකාරයක් කරන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

සභාවේ සේවකයෙකු වන නිසා විශේෂ කාර්යයක් සේ සලකා රු.5000/- ක මුදලක් ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

### 05:03 **පරිගණක මෘදුකාංගයක් ලබාගැනීම**

බළන්ගොඩ තානායමේ ගිණුම් වාර්තා විධිමත්ව හා කාර්යක්ෂම ලෙස පිළියෙල කිරීම සඳහා පරිගණක මෘදුකාංගයක් ලබාගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලා , ඉදිරිපත් කරඇති ලිපියක් සභාගත කරන ලදුව මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

### 05:04 **නගර සභා තානායමේ ගෙවීම් කටයුතු ක්‍රෙඩිට් කාඩ් මගින් ගෙවීම් කිරීම සඳහා ලංකා බැංකුවේ නව ගිණුමක් ආරම්භ කිරීම**

බළන්ගොඩ නගර සභා තානායමේ ක්‍රෙඩිට් කාඩ් මගින් ගෙවීම් කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍රය ලංකා බැංකුව මගින් ලබාගැනීමට කටයුතු කර ඇති බැවින් , හා ලංකා බැංකුව මගින් කාර්යක්ෂම සේවාවක් ලබාදෙන බැවින් , තානායමේ ගණුදෙනු සඳහා දැනට මහජන බැංකුවේ ඇති 017100180032614 අංක දරණ ජංගම ගිණුම වෙනුවට ලංකා බැංකුවේ නව ගිණුමක් ආරම්භ කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

### 05:05 **දේවිකා සමරනායක මියගේ නිවසට ජලය ගලාඒම**

ඉහත සඳහන් කරුණට අදාළව බළන්ගොඩ , තුඹගොඩ,සුදර්ශනගම, අංකඃ 82 දරණ ලිපිනයේ පදිංචි දේවිකා සමරනායක මිය විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

මාර්ගය අයින දිගට යොදා තිබූ ආධාරක පස් වැටිය මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ දී ඉවත් කිරීම හේතුවෙන් වර්ෂා දිනවල දී වැසි ජලය නිවස තුළට ගලා එන බැවින්, නිවසේ කාමර කිහිපයක්

ජලයෙන් යට වු බැවින් , මෙම තත්ත්වය වැළැක්වීම සඳහා මාර්ගය අයිනෙන් අඩි 20 ක් පමණ දිගට ආරක්ෂිත පැති බැම්මක් ඉදිකරදෙන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

මාර්ගයේ ආරක්ෂාව සඳහා ප්‍රදේශවාසීන්ගේ දායකත්වයෙන් බැම්මක් සකස් කිරීම සඳහා වැලි කියුබ් 02 , ගල් කියුබ් 02 ක් හා සිමෙන්ති මිටි 10 ක් ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:06 ICTAD **ලියාපදිංචිය ලබාගැනීම හා කර්මාන්ත රක්ෂණය සහතිකයක් කොන්ත්‍රාත් වලට ලබාගැනීම.**

සභාව විසින් කර්මාන්තයන් කොන්ත්‍රාත් ලබාදීමේ දී මින් ඉදිරියට ICTAD ලියාපදිංචිය ලබාගෙන තිබීම සහ කර්මාන්ත රක්ෂණය සහතිකයක් තිබේ නම් පමණක් කොන්ත්‍රාත් ලබාදීම කල යුතු වන බැව් අවධාරණය කරමින් ඉදිරිපත් කර ඇති ලිපියක් ගරු සභාවේ අනුමැතිය සඳහා සභාගත කරන ලදී.

මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී .

05:07 **මහජනපොළ ඉදිකිරීමේ අවසාන වාරිකය ගෙවීම - සැම්ඩැම් සමාගම රු.539,183.71**

බළන්ගොඩ මහජන පොළ ඉදිකිරීමේ අවසාන වාරිකය ගෙවීම සඳහා රු.539,183.60 ක මුදලක් සැම් ඩැම් සමාගම වෙත ගෙවීම සඳහා ඉදිරිපත් කර ඇති බිල්පතක් සභා අනුමැතියට ඉදිරිපත් කර තිබුණි.

අදාල බිල්පත පියවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:08 SMS **ආයතනයට ගල් මිළදී ගැනීම් සඳහා ගෙවීම් අනුමැතිය ලබාගැනීම.රු.718,883.60**

ඉහත සඳහන් කරුණට අදාළව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

හුණුකුඹුර පාර ii අදියර ( හුණුකුඹුර කෝපිවත්ත පාර ) හා උඩකන්ද ගල්වල පාර ii අදියර සංවර්ධනය කිරීම සඳහා යොදා ගන්නා ලද කොන්ක්‍රීට් කුට්ටි ගල් 23270 ක් සඳහා රු.718883.60 ක් වු බිල්පතක් අදාල සමාගම විසින් ඉදිරිපත් කර ඇත.

කොන්ත්‍රාත් සමිතිය මගින් ඉටුකල වැඩ කොටස් සඳහා යොදා ගන්නා ලද ගල්වල වටිනාකම එම සමිතියෙන් අයකර ගැනීමට යටත්ව සහ සභාව මගින් ඍජු ශ්‍රමය යටතේ ඉටුකල වැඩ කොටස් සඳහා යොදා ගන්නා ගල් වලට ගෙවිය යුතු වු මුළු මුදල ද ඇතුළත්ව ගෙවීමට සභාවේ අනුමැතිය ඉල්ලා තිබිණ.

අදාල මුදල ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:09 SMS **ආයතනයට ගල් මිළදී ගැනීම් සඳහා ගෙවීම් අනුමැතිය ලබාගැනීම.රු.1038000/-**

ඉහත සඳහන් ආයතනයෙන් ගෙන්වන ලද කොන්ක්‍රීට් කුට්ටි ගල් 34600 ක් සඳහා එක්ගලකටරු.10,38000/- ක බිල්පත අදාළ සමාගම වෙත ගෙවිය යුතුව ඇති අතර , කොන්ත්‍රාත් සමිතිය මගින් ඉටුකල වැඩ කොටස් සඳහා යොදා ගන්නා ලද ගල්වල වටිනාකම එම සමිතියෙන් අයකර ගැනීමට යටත්ව සහ සභාව මගින් ඍජු ශ්‍රමය යටතේ ඉටුකල වැඩ කොටස් සඳහා යොදා ගන්නා ගල් වලට ගෙවිය යුතු වු මුළු මුදල ද ඇතුළත්ව ගෙවීමට සභාවේ අනුමැතිය ඉල්ලා තිබිණ.

අදාල මුදල ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:10 **ජී.ජී.සෝමරත්න ඇතුළු පිරිස - හියුම් පයිප්ප 02 ක් ලබාගැනීම**

ඉහත සඳහන් කරුණට අදාළව බළන්ගොඩ, ඕළුගන්තොට,ගල්අරාව යන ලිපිනයේ පදිංචිජී.ජී.සෝමරත්න මහතා ඇතුළු ප්‍රදේශවාසීන්ගේ අත්සන් සහිතව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

ඕළුගන්තොට වෙල්යායට ජලය ලබාගන්නා ඇල හරහා ඇති මාර්ගය ප්‍රදේශවාසීන් විසින් සකස් කර ඇති ඇත.

මෙම මාර්ගය නිවාස කිහිපයකට යාම සඳහා යොදාගනී. හදිසි අවස්ථාවකදි රෝගියෙකු රැගෙන යාම සඳහා ත්‍රී රෝද රථයක් හෝ ඇල හරහා ගමන් කිරීම ධාවනය කිරීම අපහසු එබැවින් , ප්‍රදේශවාසීන්ගේ වියදමින් බෝක්කුවක් සාදා ගැනීම සඳහා අවශ්‍ය හියුම් පයිප්ප ( විශ්කම්භය 1'.6" දිග 8' ක ) 02 ක් ලබාදෙන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

හියුම් පයිප්ප 02 ක් ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:11 **පොදු වෙළඳපලේ හිඟ විදුලි බිල්පත් ගෙවීම රු.41,526.89**

උක්ත කරුණට අදාළව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

පොදු වෙළඳසලේ විදුලිය සිදලීමේ නිවේදනයක් ලැබී ඇති අතර , එහි සඳහන් මුදල පැරණි හිඟයක් එකතු වීම නිසා සිදුව ඇති බව දන්වා ඇති අතර , එම බිල්පතේ සඳහන් වන රු.40726.89 ක මුදල ගෙවා ඇති බැවින් , ඒ සඳහා සභාවේ ආවරණ අනුමැතිය ඉල්ලා තිබිණ.

මේ සඳහා සභාවේ ආවරණ අනුමැතිය ලබාදෙන ලදී.

05:12 **බළන්ගොඩ නගර සභාවේ නිල නිවාසවල මාසික ආර්ථික කුළිය තක්සේරු කිරීම**

බළන්ගොඩ නගර සභාවට අයත් නිල නිවාසවල මාසික ආර්ථික කුළිය පහත සඳහන් පරිදි තක්සේරු කර ඇති බව දන්වමින් සබරගමුව පළාත් තක්සේරුකරු විසින් එවා ඇති අංකඃ ආර්ටී/ආර්ජී/1229 හා 2010.12.23 දිනැති ලිපිය සභාගත කරන ලදී.

| අනු අංකය | නිල නිවස | මාසික ආර්ථික කුළිය |
|---|---|---|
| 01 | රත්නපුර පාර, වරිපනම් අංකඃ 217/17 ලේකම් නිල නිවස | රු.2,000.00 |
| 02 | රත්නපුර පාර වරිපනම් අංකඃ 217/18 නිල නිවස | රු.1350.00 |
| 03 | පරණ පාර , වරිපනම් අංකඃ 04 නිල නිවස | රු.1300.00 |
| 04 | පරණ පාර , වරිපනම් අංකඃ 06 ( කා.නි.) නිල නිවස | රු.1000.00 |
| 05 | පරණ පාර, වරිපනම් අංකඃ 08 ( වැ.අ.) නිල නිවස | රු.1500.00 |

ඉහත සඳහන් කුළියෙන් 50% ක් අයකිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

## 05:13 නව සතිපොලෙහි කඩ කාමර ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා ලබාගැනීම

බළන්ගොඩ මහජනපොළේ දීර්ඝ කාලයක සිට මේ දක්වා වෙළඳ ව්‍යාපාර කරගෙන යන බැවින් නව සතිපොලෙහි කඩ කාමරයක් වෙළඳ ව්‍යාපාර කරගෙන යාම සඳහා ලබාදෙන ලෙස ඉල්ලමින් පහත සඳහන් 11 දෙනා විසින් ඉදිරිපත් කර ඇති ලිපි සභාගත කරන ලදී.

| | |
|---|---|
| 01. ගුණසේකර පරණ විතාන මහතා | බළන්ගොඩ මහජන පොළ |
| 02. ආර්.ජේ.කේ.ඩී.නිශාන්ත මහතා | අංක:19,පරණ බස්නැවතුම්පල,බළන්ගොඩ. |
| 03. ඩී.වී.විජයකුමාර මහතා | අංක: 63, සුරංග ස්ටෝර්ස්,කෙළින් වීදිය, බළන්ගොඩ. |
| 04. ඊ.ඒ.රෝහණ සමන් කුමාර මහතා | අංක: 9/59,කිරිඳිගල,බළන්ගොඩ. |
| 05. ආර්.වී.ඩී.සෝමසිරි මහතා | මුගුණමලය,බළන්ගොඩ. |
| 06. ඉන්දික එරික් සිසිල් | 118/6,බලගහමුල,බළන්ගොඩ. |
| 07.ඩබ්.එම්.එල්.පී.වීරසිංහ මහතා | අංක:32/18,කරව්කැටිය,බළන්ගොඩ. |
| 08. කේ.ජී.නිහාල් ජයසිරි මහතා | 30/2, ක්‍රීඩාංගන පාර,බළන්ගොඩ. |
| 09. වී.එම්.ආර්.රූපසේන මහතා | 710 එෆ්, මුගුණමලය,බළන්ගොඩ. |
| 10. ආර්.කේ.ජයසුන්දර මහතා | 63/13, රාස්සගල පාර,බළන්ගොඩ. |
| 11. ඊ.ඒ.ඩී.ඉන්දික නිරෝෂන් මහතා | 339/38, අක්කර 18, බලගහමුල,බළන්ගොඩ. |

මේ සම්බන්ධ සාකච්ඡා කල සභාව , ඉදිරිපෙළ කඩ කාමර 06 පෙර ගෙවීම්(කීමනි) ක්‍රමයටත් , පසුපෙළ කඩ කාමර 05 මාස 06 ක තැන්පතුවක් ලබාගෙන බදුදීමටත් , සභාවේ අනුමැතිය ලබාදෙන ලදි. පළාත් තක්සේරු විසින් එවා ඇති තක්සේරු වාර්තාව පිළිගෙන ස්ථිර පොළෙහි තාවකාලික මඩු සාදාගෙන සිටි අයගේ ඉල්ලීම් සලකා ටෙන්ඩර් කිරීමකින් තොරව පැරණි පොළේ ව්‍යාපාර පවත්වාගෙන ගිය කඩහිමියන් හට මෙම කඩ කාමර 11 ලබාදීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර , එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම යෝජනාවට ගරු නාගරික මන්ත්‍රී යූ.එච්.ගාමිණී මැතිතුමා එකඟතාව පළනොකල අතර , එය විමසන අවස්ථාවේ දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.විමලසේන මැතිතුමා සභා ගර්භයේ නොසිටින ලදී. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර මැතිතුමා මෙහි නීත්‍යානුකූල තත්ත්වය පැහැදිලි කරන ලෙස ලේකම් මහතාගෙන් ඉල්ලීමක් කරන ලදී.

2009/1 චක්‍රලේඛනයේ පවත්නා සියලුම තත්ත්වයන් සම්බන්ධය ලේකම්වරයා විසින් පැහැදිලි කරන ලදී. ඉන්පසුව ගරු නාගරික මන්ත්‍රී යූ.එච්.ගාමිණී මැතිතුමා හැර අනෙකුත් ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනාගෙන් එකගත්වයෙන් යෝජනාව සභා සම්මත විය. ඊට අමතරව විවෘත පොළ කඩ කාමරයක් රු.200/- කට දෛනික කුළිය මත සිටින අයගෙන් රු.50/- බැගින් අයකර ලබාදීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

- ❖ නව සතිපොළෙහි කඩ කාමර 10 ක් බුලත් වෙළඳුන් සඳහා වෙන්කර දෙන ලෙස ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 05:14 **ගලි බවුසරයට අත්තිකාරමක් ලබාගැනීම**

මෙම නගර සභාව සතු අංකඃ 227/5020 දරණ ගලි බවුසරයට අලුතින් ටැංකියක් සෑදීම වෙනුවෙන් තෙබුවන ගරාජයට රු.300000/- ක අත්තිකාරම් මුදලක් ලබාදෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

### 05:15 **නාගරික සංවර්ධන අධිකාරියේ සමරු කලාපයේ දැන්වීමට ගෙවීම - රු.15,000/-**

නාගරික සංවර්ධන අධිකාරියේ සුබ සාධක සංගමයට ආධාර පිණිස උදයසිරි වික්‍රමරත්නගේ " සුද්දෙක් ඔබ අමතයි " වේදිකා නාට්‍ය 2010 නොවැම්බර් මස 12 වැනිදින බත්තරමුල්ල ජනකලා කේන්ද්‍රයේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇති බැවින් , ඒ සඳහා පළකරන සමරු කලාපය සඳහා මූල්‍යමය සහයෝගයක් ලබාදෙන ලෙස ඉල්ලා , නාගරික සංවර්ධන අධිකාරියේ සුභ සාධක සංගමයේ සභාපති විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

සමරු කලාපයේ තානායම පිළිබඳව දැන්වීමක් පළකිරීමටත් තානායම් ගිණුමෙන් සාමාන්‍ය පිටු කාලක් සඳහා රු.15,000/- ක මුදලක් ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

### 05:16 **කඩ කාමර අංකඃ 06 මුල් ටෙන්ඩර ඉවත් කරගැනීම**

ඉහත සඳහන් කරුණට අදාළව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

බළන්ගොඩ නගර සභාව විසින් දිර්ඝ කාලීනව බදු දී තිබූ විවෘත කඩ අංකඃ 06 දරණ කඩ කාමරය රු.135000/- ක හිඟ කඩ කුලී මුදල නොගෙවා පැහැර හැරීම නිසා සභාව වෙත නැවත පවරා ගන්නා ලදී.

පසුව ටෙන්ඩර් කිරීමේ දී ටී.එම්.සමන්ත කුමාර යන අය ටෙන්ඩරය ලබාගෙන මාසිකව නියමිත පරිදි කඩකුලී ගෙවමින් පවත්වාගෙන යන ලදි. නමුත් දිර්ඝ කාලීනව මෙම කඩය ලබාගෙන තිබූ ඩබ්.එල්.ආනන්ද යන අයට නැවත කඩ ලබාගැනීමට අවස්ථාව ලබාදීම සඳහා මෙම කඩය 2011 වර්ෂයට ටෙන්ඩර් කරන ලද අතර , පහත සඳහන් අය ටෙන්ඩර් මිළ ගණන් ඉදිරිපත් කර තිබුණි. ( ඩබ්.එල්.ආනන්ද මහතා ටෙන්ඩර්පත් ලබාගෙන නොතිබුණි.)

| | |
|---|---|
| 01. ඉස්මයිල් මොහොම්මදු රසීක් | 12050.00 |
| 02. එම්.කේ.රේණුකා ප්‍රියදර්ශනී | 10780.00 |
| 03. ටී.එම්.සමන්ත කුමාර | 10050.00 |

ඉස්මයිල් මොහොම්මදු රසීක් හා එම්.කේ.රේණුකා ප්‍රියදර්ශනී යන අය ටෙන්ඩරය ඉල්ලා අස්කර ගන්නා බවට ලිඛිතව දන්වන ලද අතර , ඩබ්.එල්.ආනන්ද යන අය ටෙන්ඩර් පටිපාටියෙන් තොරව එම කඩ කාමරය නැවත තමන් වෙත ලබාදෙන ලෙස ඉල්ලා ඇත. මේ සම්බන්ධව කටයුතු කල යුතු ආකාරය සම්බන්ධව මෙමගින් උපදෙස් ඉල්ලා තිබිණ.

පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් පරිදි 1/2009 අනුව ටෙන්ඩරය අවලංගු කිරීමටත් , ඩබ්.එල්.ආනන්ද යන අයගෙන් රු.9750/- කුළියට ලබාගැනීමට එකඟවන්නේ ද යන්න විමසීමටත් , එකඟවන්නේ නම් , ඔහුට ලබාදීමට , එසේ නොමැති නම්, සමන් කුමාර යන අයට ලබාදීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**05:17 2011 වර්ෂයේ බළන්ගොඩ නගර සභා බලප්‍රදේශය තුළ විදුලි රැහැන් මාර්ග අවට හෙලිපෙහෙලි කිරීම -නගර සභාවට ලබාගැනීම**

ඉහත කරුණ සම්බන්ධව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සබරගමුව ) අමතන ලද මෙම සභාවේ අංකඃ බනස/ක/3/15 හා 2010.11.30 දිනැති ලිපියට අදාළව රත්නපුර ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රධාන ඉංජිනේරු විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

එමගින් 2011 වර්ෂයේ නගර සභා බලප්‍රදේශය තුළ රැහැන් මාර්ග අවට හෙලිපෙහෙලි කිරීමේ කාර්යය නගර සභාවට ලබාදෙන ලෙස ඉල්ලීමක් කර ඇති බැවින් මංවර හෙලිකිරීමේ කොන්ත්‍රාත් කටයුතු සඳහා ලියාපදිංචිවීමට අවශ්‍ය බැවින් 2011 වර්ෂයට ලියාපදිංචිවීමට අදාළව ටෙන්ඩර් පත්‍රිකාව සම්පූර්ණකර එවන ලෙස එමගින් දන්වා තිබිණ.

මෙම කාර්යය ඉටුකිරීම සඳහා වෙනම සේවක මණ්ඩලයක් බඳවා ගත යුතු බැවින් , මෙය ලබාගැනීම ප්‍රතික්ෂේප කිරීමට සභාව අනුමත කරන ලදී.

**05:18 බළන්ගොඩ බස්නැවතුම්පල කඩ කාමර අංකඃ සී 17 දරණ කඩ කාමරය දඩ මුදල් නිදහස් කිරීම**

බළන්ගොඩ බස්නැවතුම්පල අංකඃ සී 17 දරණ කඩ කාමරය විශාල මුදලක් ගෙවා ආපන ශාලාවක් පවත්වාගෙන යෑම සඳහා ටෙන්ඩරයක් මගින් බදුලබාගත් අතර , ආපන ශාලාවක් පවත්වාගෙන යාම සඳහා අවසර ලබාදිය නොහැකි බව නගර සභාව විසින් දැණුම් දුන් බැවින් කඩ කාමරය මේ දක්වා විවෘත කිරීම සිදුනොකරන ලදී. මෙම කඩ කාමරය සඳහා දඩ මුදල් හිලව් කර ඇති බැවින් , එය ගෙවීම අපහසු වන නිසා දඩ මුදලින් නිදහස් කරන ලෙසත් , කඩ කුළිය පමණක් ගෙවීමට එකඟතාවය පළකරන බවත් සඳහන් කරමින් , ඉහත කඩකාමරයේ බදුකරු ජී.එච්.සුමතිපාල යන අය විසින් ඉදිරිපත් කර ඇති 2010.12.30 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ඉහත අංක දරණ කඩ කාමරය සහ අංකඃ සී,13/14 හා 15 දරණ කඩ කාමරය පිහිටි ස්ථානයන් ජනාකීර්ණ ස්ථානයන් නොවන නිසා සහ එම කඩ කාමරය බදුලබාගත් දින සිට මේ දක්වා දඩ මුදල් වලින් නිදහස් කිරීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුමී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව යෝජනාව සභා සම්මත විය. ඔහු වෙත විධිමත් බදු ඔප්පුවක් මගින් කඩය පැවරීමට නොහැකි වූ බැවින් දඩ මුදල් ඉවත්කර කඩකුළිය පමණක් අයකර ඉඩමේ අයිතිය නැවත හෝ බදු ඔප්පුවක් මගින් පැවරීමට තීරණය කරන ලදී.

**05:19 ඉවතලන කඩදාසි වෙන්කර එකතු කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රගතිය**

බළන්ගොඩ නගරය තුළ තිබෙන ආයතන වලින් ඉවතලන කඩදාසි වෙන්කර එකතු කිරීමේ වැඩ සටහනක් 2010 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද අතර , එම වැඩ සටහනට දායකවීම නිසා ඒ සඳහා මූල්‍යමය අගයක් ලැබී ඇති බැවින් , අදාල ආයතන ඇගයීම සඳහා සම්මානයක් සකස් කර 2011 ජනවාරි මස මහා සභා රැස්වීමේ දී ප්‍රදානය කිරීම සුදුසු බව සඳහන් කරමින් ඉදිරිපත් කර ඇති 2010.12.30 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:20 **හුණුකුඹුර මාර්ගය සුනිල් ගරාජය අසලින් පහල මාර්ගය බැම් බැඳ සංවර්ධනය කිරීම කර්මාන්තය**

ඉහත සඳහන් කරුණට අදාළව ඉදිරිපත් කරන ඇති ලිපියක් සභාගත කරනලදී.

යථෝක්ත කර්මාන්තයේ වැඩ අවසන් වී ඇති අතර , ඇල මාර්ගයට හානිවන අයුරින් මාර්ගයට බැම් බැදීමක් කර ඇති බව ගොවිජන සේවා නිලධාරී විසින් දන්වන ලදී. මේ සම්බන්ධව 2010.12.30 දින පෙ.ව.10.00 ගොවිජන සේවා නිලධාරී සමඟ සාකච්ඡාවක් පවත්වන ලද අතර , එහිදී ඇල වේල්ල නැවත සකස් කරදෙන ලෙස ඉල්ලීමක් කල බවත් , මේ වන විට බැම්මේ වැඩ අවසන් කර ඇති බැවින් බැම්මට හානි නොවන අයුරින් ඇල වේල්ල සකස් කිරීම සුදුසු බැව් මෙමගින් වාර්තා කර තිබුණි.

ඇල වේල්ල සකස්කරදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදි.

05:21 **වැය මාරු කිරීම**

ඉහත සඳහන් කරුණට අදාළව ඉදිරිපත් කරඇති ලිපියක් සභාගත කරන ලදී.

| ප්‍රතිපාදන ඉතිරි වැය ශීර්ෂය | විස්තරය | මුදල | ප්‍රතිපාදන අවශ්‍ය වැය ශීර්ෂය | විස්තරය | මුදල |
|---|---|---|---|---|---|
| 1-1-412 | වැටුප් හා වේතන | 100,000 | 1-1-411 | වැටුප් හා වේතන | 150,000 |
| 1-1-428 | අභ්‍යන්තර නිලධාරීන් පුහුණු කිරීම් | 100,000 | 1-1-416 | ජීවන වියදම් දීමනාව | 100,000 |
| 1-1-459 | වෙනත් (විගණන ගාස්තු ඇතුළු) | 300,000 | 1-1-453 i | අවශ්‍යතා විදුලිය | 50,000 |
| 1-1-481 | විශ්‍රාම වැටුප් ( ප.පා.විශ්‍රාමික) | 100,000 | 1-1-453-ii | අවශ්‍යතා විදුලිය | 20,000 |
| 1-2-412 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 45,000 | 2-2-439 | අවශ්‍යතා ජලය | 50,000 |
| 3-3-441 | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ නඩත්තුව | 300,000 | 2-3-411 | වැටුප් හා වේතන | 100,000 |
| 3-3-442 | අලුත්වැඩියාව නඩත්තු ඉදිකිරීම් පහසුකම් හා ප්‍රවාහන | 300,000 | 2-3-441 | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ නඩත්තුව | 100,000 |
| 3-4-451 | | 100,000 | 2-3-453 | අවශ්‍යතා ( විදුලිය , ජලය ) | 50,000 |
| | | | 2-9-453 | මිළදී ගැනීම් | 150,000 |
| | | | 3-3-431 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ | 50,000 |
| | | | 3-3-432 | ඉන්ධන හා ස්නේහක | 100,000 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | තෙල් | |
| | | | 3-4-416 | ජීවන වියදම් දීමනාව | 75,000 |
| | | | 5-2-453-ii | අවශ්‍යතා ජලය | 100,000 |
| | | | 6-2-431 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ ( පුවත්පත් ) | 200,000 |
| | | | 6-6-416 | ජීවන වියදම් දීමනාව | 50,00 |
| | | | | | **1,345,000** |

ඉහත ප්‍රතිපාදන ඉතිරි වී ඇති වැය ශීර්ෂ වලින් ප්‍රතිපාදන අවසන් වී ඇති වැය ශීර්ෂ වලට මුදල් මාරුකිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

## 06. මුදල් ගෙවීම් අනුමත කිරීම ( රු.10000/- ට වැඩි ගෙවීම්)

2010.11.19දින සිට 2010.12.28 දක්වා රු.10000/- ට වැඩි ගෙවීම් පිළිබඳ විස්තරයක් සභාවට ඉදිරිපත් කරන ලදී.

| දිනය | විස්තරය | ව.අ. | චෙක්පත් අංකය | මුදල |
|---|---|---|---|---|
| 2010.10.23 | පී.සී.සිස්ටම්ස්<br>නගර සභාව සතු ML 1640 ප්‍රින්ටරය සඳහා කාට්ලේජ 02 ලබාගැනීම | 74 | 204280 | 17500.00 |
| 2010.11.29 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලිබල මණ්ඩලය<br>2010 ඔක්තෝබර් මස විදුලිය බිල්පත පියවීම<br>පොදු වෙළඳසැල/ප්‍රේක්ෂකාගාරය | 81 | 204317 | 11029.50 |
| 2010.11.29 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලිබල මණ්ඩලය2010 ඔක්තෝබර් මස විදුලිය බිල්පත පියවීම<br>කාර්යාලය/යාබද විවේකාගාරය | 84 | 204317 | 17698.50 |
| 2010.11.29 | සාමාන්‍යාධිකාරී ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>2010.10.01 සිට 2010.10.08 දින දක්වා ඉන්ධන බිල්පත පියවීම | 85 | 204318 | 53592.80 |
| 2010.11.29 | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>2010.10.08 සිට 2010.10.13 දින දක්වා ඉන්ධන බිල්පත පියවීම | 86 | 204318 | 52320.40 |
| 2010.11.29 | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>ඉදිකිරීම් කටයුතු සඳහා සිමෙන්ති මිටි 25 ලබාගැනීම | 87 | 204319 | 17750.00 |
| 2010.11.29 | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්<br>2010 iii කාර්තුවට අදාළ වැට් බද්ද ගෙවීම ( පොදු ගිණුම ) | 88 | 204320 | 56937.00 |
| 2010.11.29 | මොට්‍රොපොලිටන් ඔෆීස් ප්‍රයිවට් ලිමිටඩ්<br>කාර්යාලය සතු එන්.1215 ඡායා පිටපත් යන්ත්‍රය අළුත්වැඩියාවට අවශ්‍ය අමතර කොටස් වෙනුවෙන් | 94 | 204324 | 28335.39 |

| | | | | |
|---|---|---|---|---|
| | මුදල් ගෙවීම | | | |
| 2010.11.29 | ජේ.ජී.පී.වික්‍රමසිංහ<br>මහජන පුස්තකාලයට හා නව කියවීම් ශාලාවට 2010 ඔක්තෝබර් මාසය සඳහා පුවත්පත් සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම | 98 | 204328 | 16620.00 |
| 2010.11.29 | ඒ.එම්.ඩිස්ට්‍රිබියුටර්ස්<br>තානායම සඳහා 20 වෝ.විදුලි බුබුළු 70 හා 65 වෝ විදුලි බුබුළු 03 ලබාගැනීම | 99 | 204329 | 40873.50 |
| 2010.11.29 | සුනිල් ගෝවින්නගේ<br>හෝස් පවර් 02 කම්පෙෂර් විදුලි මෝටරය එතීම සහ ඊට අවශ්‍ය කන්ඩෙන්සර් යෙදීම හා කොම්පෝස්ට් පොහොර අංගනයේ SS HP මෝටරය කන්ඩෙන්සර් යොදා එතීම සඳහා මුදල් ගෙවීම. | 100 | 204330 | 30735.00 |
| 2010.11.29 | ඊ.එම්.අතුල කීර්ති<br>ප්ලාස්ටික් පසු භාවිත ව්‍යාපෘතිය මගින් නගර සභාව වෙත ප්‍රදානය කරන ලද ට්‍රැක්ටර් රථය හා ටේලරය කොළඹ සිට බළන්ගොඩ දක්වා බෲම් රථයක පටවා ප්‍රවාහනය කිරීමේ දී වැය වූ මුදල ලබාදීම | 103 | 204332 | 26000.00 |
| 2010.11.29 | ඉන්දික එරික් සිසිල්<br>එප්පාවල සිට බළන්ගොඩ දක්වා පොස්පේට් ප්‍රවාහනය කිරීම වෙනුවෙන් ප්‍රවාහන ගාස්තු ගෙවීම | 104 | 204334 | 22500.00 |
| 2010.11.29 | පී.ෂසිකුමාර්<br>බළන්ගොඩ තානායමේ නව දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම කර්මාන්තයේ කොන්ක්‍රීට් කණු සකස් කිරීම සඳහා අත්තිකාරම් ගෙවීම | 105 | 204335 | 49500.00 |
| 2010.11.29 | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්<br>2010 ඔක්තෝබර් මස දුරකථන බිල්පත් පියවීම<br>2287275/2287153/2286596/2288737/E-mail | 91 | 204336 | 19975.29 |
| | 2010 දෙසැම්බර් මාසය | | | |
| 2010.12.01 | බී.ගුණරත්න<br>2010.11.16 සිට 2010.11.30 දක්වා නගරයේ කසල එකතු කිරීම හා ප්‍රවාහනය | 01 | 204337 | 95554.16 |
| 2010.11.29 | නුවන් දේශාන් ගුණතුංග<br>මහමෙවුනා භාවනා අසපුව අසල සිට නාවනැල්ල මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම ( i අදියර ) කර්මාන්තයේ කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම | 03 | 204340 | 47056.00 |
| 2010.11.29 | සභාපති, තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය<br>වැකුඹුර කනත්ත මාර්ගය බැම්ම බැඳ සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ අවසන් ගෙවීම | 04 | 204342 | 210250.00 |
| 2010.12.03 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>2010 ඔක්තෝබර් මස ජල බිල්පත පියවීම<br>පොදු වෙළඳසැල | 06 | 204344 | 29663.20 |
| 2010.12.03 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>2010 නොවැම්බර් මස ජල බිල්පත පියවීම - කාර්යාලය | 07 | 204344 | 14909.44 |
| 2010.12.03 | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ් | 08 | 204345 | 23573.34 |

| | | | | |
|---|---|---|---|---|
| | දුරකථන බිල්පත් පියවීම. 2288565/2287024/2288400/3452931/3452939/2287023 | | | |
| 2010.12.03 | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය 2010.11.01 සිට 2010.11.04 දක්වා ඉන්ධන බිල්පත පියවීම | 09 | 204346 | 64853.00 |
| 2010.12.03 | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය 2010.10.16 සිට 2010.10.29 දක්වා ඉන්ධන බිල්පත පියවීම | 10 | 204346 | 70059.20 |
| 2010.12.03 | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය 2010.09.29 සිට 2010.10.30 දක්වා ඉන්ධන බිල්පත පියවීම | 11 | 204346 | 12496.40 |
| 2010.12.03 | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය 2010.10.14 සිට 2010.10.21 දක්වා ඉන්ධන බිල්පත පියවීම | 12 | 204346 | 65852.80 |
| 2010.12.03 | ඩැක්ස් ඉංජිනියරින් කම්පැණි ප්‍රයිවට් ලිමිටඩ් බොබ් කැට් යන්ත්‍රයේ මීටර් පැය 2750 සේවාව වෙනුවෙන් මුදල් ගෙවීම | 21 | 204349.00 | 30817.32 |
| 2010.12.03 | පී.එස්.ටයර් වර්ක්ස් ජී.කේ.1483 ට්‍රැක්ටර් රථයට ටයර් 02 ක් හා ටියුබ් 02 ලබාගැනීම | 22 | 204350 | 27522.00 |
| 2010.12.03 | එච්.එල්.ඩබ්.ඉංජිනියරින් සර්විසස් 56-1906 කෘෂ කැබ් රථය අලුත්වැඩියා කිරීමට අවශ්‍ය අමතර කොටස් ලබාගැනීම | 23 | 2066553 | 41624.55 |
| 2010.12.03 | පතිරණ ඉලෙක්ට්‍රිකල්ස් තානායම විදුලි අලුත්වැඩියා කටයුතු සඳහා විදුලි උපාංග ලබාගැනීම | 25 | 206554 | 16420.00 |
| 2010.12.03 | කේ.ජී.ගෙන්ගාදරන් කොම්පෝස්ට් පොහොර ඇසුරුම් කිරීමට හිස් ඉටි උර 1000 ලබාගැනීම | 29 | 206558 | 18000.00 |
| 2010.12.03 | ඇල්ෆා ඉන්ඩස්ට්‍රීස් ප්‍රයිවට් ලිමිටඩ් තානායම සඳහා මුදල් සේප්පුවක් ලබාගැනීම | 30 | 206559 | 28717.92 |
| 2010.12.03 | ජී.ඩබ්.ඉන්ද්‍රලාල් ඉදිකිරීම් කටයුතු සඳහා වැලි කියුබ් 03 ලබාගැනීම | 31 | 206560 | 12000.00 |
| 2010.12.03 | චන්දිමා සුගතදාස අභියාචනාධිකරණ නඩු අංකඃ 32/08 සඳහා 2009.11.25 , 2010.02.16 , 2010.06.18 යන දිනවල අධිකරණයේ පෙනී සිටීම හා ලිඛිත සැල කිරීම් සකස් කිරීම වෙනුවෙන් ගාස්තු ගෙවීම | 32 | 266561 | 20000.00 |
| 2010.12.03 | ජී.ඒ.එන්.බණ්ඩාර බළන්ගොඩ හුණුකුඹුර කෝපිවත්ත මාර්ගයට ගල්රෝල දින 2 1/2 යෙදවීම හා මහමෙවුනා භාවනා අසපුව අසල සිට නාවනැල්ල මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම සඳහා ගල්රෝල දින 1 1/2 යෙදවීම වෙනුවෙන් මුදල් ගෙවීම | 33 | 206562 | 18000.00 |
| 2010.12.03 | සභාපති, කිරිදිගල ග්‍රාම සංවර්ධන සමිතිය | 34 | 206563 | 86027.12 |

| | | | | |
|---|---|---|---|---|
| | ඕළුගන්තොට සියඹලාගහවත්ත පාරේ පොඩි අප්පුහාමි මහතාගේ නිවස ඇතුළු නිවාස වලට යන පාලම ඉදිකිරීම වෙනුවෙන් අවසන් ගෙවීම | | | |
| 2010.12.03 | සභාපති, තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය මග නැගුම ව්‍යාපෘතිය මගින් සිදුකරන සුදර්ශනගම දකුණු පස මාර්ගයේ අවසාන කෙළවර අඩි 32 කොන්ක්‍රීට් කිරීම අවසන් ගෙවීම. | 35 | 206564 | 25375.03 |
| 2010.12.03 | කේ.ඒ.අයි.නිශාන්ත ( සිටි ඉලෙක්ට්‍රිකල්ස් ) තානායම ප්‍රධාන විදුලි පුවරුව හා තානායම ජල ටැංකිය විදුලි සම්බන්ධතාවය ලබාගැනීම වෙනුවෙන් විදුලි උපාංග ලබාගැනීම | 37 | 206565 | 22376.67 |
| 2010.12.03 | සභාපති, තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය උඩ ඇල්ලෙපොල වැවේගෙදර පාර බැම්ම බැඳ සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ ( මග නැගුම ) 20% අත්තිකාරම් ගෙවීම | 38 | 206566 | 73529.00 |
| 2010.12.03 | සභාපති, තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය වැකුඹුර කනත්ත පාර කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම කර්මාන්තයේ ( මග නැගුම ) 20% අත්තිකාරම් ගෙවීම | 39 | 206566 | 75000.00 |
| 2010.12.03 | සභාපති, තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය වැකුඹුර කනත්ත මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ 20% අත්තිකාරම් ගෙවීම | 40 | 206566 | 73529.00 |
| 2010.12.03 | සභාපති, කිරිදිගල ග්‍රාම සංවර්ධන සමිතිය මැද කිරිදිගල මාර්ගය කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම iv අදියර කර්මාන්තයේ 20% අත්තිකාරම් ගෙවීම | 41 | 206567 | 75000.00 |
| 2010.12.03 | එස්.එම්.එස්.පේවර්ස් රියලිටි ප්‍රයිවට් ලිමිටඩ් හුණුකුඹුර කෝපිවත්ත මාර්ගය ii අදියර හා උඩකන්ද ගල්වල පාර ii අදියර සඳහා ඉන්ටර්ලොකින් කොන්ක්‍රීට් කුට්ටි ලබාගැනීම වෙනුවෙන් ගෙවිය යුතු මුදලින් 500000/- අත්තිකාරමක් ගෙවීම | 42 | 206568 | 500000.00 |
| 2010.12.03 | පී.එල්.ලසන්ත ෂමල් කුරේ බළන්ගොඩ තානායමේ පොල්අතු ගොඩනැගිල්ල ඉදිකිරීම කර්මාන්තයේ වැඩ කුළිය ගෙවීම | 43 | 206572 | 123497.04 |
| 2010.12.03 | පී,එල්.ලසන්ත ෂමල් කුරේ බළන්ගොඩ තානායමේ පොල් අතු ගොඩනැගිල්ලේ වැසිකිළිය ඉදිකිරීම කර්මාන්තයේ වැඩ කුළිය ගෙවීම | 44 | 206573 | 58902.43 |
| 2010.12.06 | ටොයෝටා ලංකා එන්.ඩී.5124 වෑන් රථයට ටයිමින් බෙල්ට් යොදා සේවාකර ක්ලච් පද්ධතිය අලුත්වැඩියා කිරීම හා වායු සමීකරණ පද්ධතිය සේවා කිරීම,පිටුපස දොර අලුත්වැඩියා කිරීම , දකුණු පස හා වම්පස අපර් ආම් දැමීම වෙනුවෙන් මුදල් ගෙවීම | 56 | 206575 | 334764.77 |
| 2010.12.31 | එන්.ආර්.දයානන්ද බළන්ගොඩ තානායමේ ගේට්ටුව ඉදිකිරීම කර්මාන්තයේ එක් කුළුණක් ඉදිකිරීම | 60 | 206588 | 12000.00 |
| 2010.12.31 | සභාපති, කිරිදිගල ග්‍රාම සංවර්ධන සමිතිය මහමෙවුනා මාවත i පටුමග කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම කර්මාන්තයට අදාළව 20% ක අත්තිකාරම් ලබාදීම | 61 | 206589 | 75000.00 |
| 2010.12.31 | සභාපති, කිරිදිගල ග්‍රාම සංවර්ධන සමිතිය මහමෙවුනා මාවත iii අදියර කොන්ක්‍රීට් කුට්ටි | 62 | 206589 | 75000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | ඇතිරීම කර්මාන්තයේ 20% අත්තිකාරම් ගෙවීම | | | |
| 2010.12.31 | සභාපති, කිරිදිගල ග්‍රාම සංවර්ධන සමිතිය<br>මහමෙවුනා මාවත ii පටුමග කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම කර්මාන්තයට 20% අත්තිකාරම් ගෙවීම | 63 | 206589 | 75000.00 |
| 2010.12.31 | සභාපති , කිරිඳිගල ග්‍රාම සංවර්ධන සමිතිය<br>වැලිහරනාව ජල ටැංකිය පාර කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීමේ කර්මාන්තයට 20% අත්තිකාරම් මුදල ලබාදීම | 64 | 206589 | 75000.00 |
| 2010.12.31 | සභාපති, තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය<br>කුමාරගම සුසාන භූමිය මාර්ගය කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම කර්මාන්තයට 20% අත්තිකාරම් මුදල ලබාදීම | 65 | 206590 | 75000.00 |
| 2010.12.31 | සභාපති, සිරි විජය ග්‍රාම සංවර්ධන සමිතිය<br>හුණුකුඹුර ගාලෙවත්ත මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයට 20% අත්තිකාරම් ලබාදීම | 66 | 206591 | 75000.00 |
| 2010.12.31 | සභාපති,සිරිවිජය ග්‍රාම සංවර්ධන සමිතිය<br>හුණුකුඹුර මාර්ගය පාලම අසල කුඹුර සහිත කොටස බැම්ම බැද කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම කර්මාන්තයේ 20% අත්තිකාරම් ලබාදීම | 67 | 206591 | 75000.00 |
| 2010.12.31 | සභාපති,අරුණාලෝක<br>ග්‍රාම සංවර්ධන සමිතිය<br>උඩ ඇල්ලෙපොල කොට බෝධිය අසල පහලට ඇති මාර්ගය බැම්ම බැදීම කර්මාන්තයේ 20% අත්තිකාරම් ගෙවීම | 68 | 206592 | 75000.00 |
| 2010.12.31 | සභාපති, කිරිදිගල ග්‍රාම සංවර්ධන සමිතිය<br>උඩකන්ද ගල්වල මාර්ගය අවසන් අදියර කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම කර්මාන්තයට 20% අත්තිකාරම් ලබාදීම | 70 | 206593 | 75000.00 |
| 2010.12.31 | සභාපති, කිරිදිගල ග්‍රාම සංවර්ධන සමිතිය<br>මැද කිරිදිගල මාර්ගය v අදියර කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම කර්මාන්තයේ 20% අත්තිකාරම් මුදල ගෙවීම | 71 | 206593 | 75000.00 |
| 2010.12.31 | සභාපති, තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය<br>බළන්ගොඩ ජාතික පාසල් වටරවුම් පාර ඉතිරි කොටස සංවර්ධන කිරීමේ කර්මාන්තයේ අවසන් ගෙවීම | 72 | 206594 | 402297.21 |
| 2010.12.31 | ටී.එම්.නිහාල් රත්නසිරි<br>බළන්ගොඩ තානායමේ පොල් අතු ගොඩනැගිල්ල,වැසිකිළිය හා ගරාජය මිදුල ඉදිකිරීම් කටයුතු සදහා මුදල් ගෙවීම | 73 | 206595 | 19150.00 |
| 2010.12.31 | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>ඉදිකිරීම් කටයුතු සදහා අවශ්‍ය සිමෙන්ති මිටි 75 ලබාගැනීම | 76 | 206597 | 53250.00 |
| 2010.12.31 | සභාපති, පාසල් සංවර්ධන සමිතිය<br>ර/ ඇල්ලෙපොල විද්‍යාලය<br>කසල කළමනාකරණ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය ඉදිකිරීම | 77 | 206598 | 250745.81 |
| 2010.12.31 | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිෂ සේවා සමුපකාර සමිතිය<br>2010.09.21 සිට 2010.10.01 දින දක්වා ඉන්ධන බිල්පත පියවීම | 78 | 206599 | 32866.40 |

| | | | | |
|---|---|---|---|---|
| 2010.12.31 | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්<br>2010 අගෝස්තු ,සැප්තැම්බර් හා ඔක්තෝබර් මාසවල රඳවා ගැනීමේ බදු මුදල් දේශීය ආදායම් කොමසාරිස් වෙත ගෙවීම | 79 | 206600 | 237022.61 |
| 2010.12.31 | එම්.ජී.පියසේන<br>2010 නොවැම්බර් මස 12 දින සිට දෙසැම්බර් 07 දක්වා පෞද්ගලික බස්රථ නැවතුම් ගාස්තු 15% තැන්පතු ආපසු ගෙවීම | 80 | 206601 | 20250.00 |
| 2010.12.31 | ජ්.එල්.සී.සී.මෙටල් ක්‍රෂර්<br>ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ගල් හා ගල් කුඩු ලබාගැනීම | 81 | 206202 | 57848.00 |
| 2010.12.31 | ජේ.එෆ්.ඩිස්ට්‍රිබියුටර්ස්<br>තානායමේ ළිදේ ජලය වගා බිමට හා වැසිකිළි වලට සැපයීම වෙනුවෙන් අවශ්‍ය ජල සැපයුම් උපාංග ලබාගැනීම | 83 | 206604 | 15927.75 |
| 2010.12.31 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලිබල මණ්ඩලය<br>2010 සැප්තැම්බර් මස විදුලිය බිල්පත පියවීම කාර්යාලය/යාබද විවේකාගාරය | 85 | 206606 | 15358.50 |
| 2010.12.31 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලිබල මණ්ඩලය<br>2010 නොවැම්බර් මස විදුලිය බිල්පත පියවීම- පොදු වෙළඳසැල | 86 | 206606 | 10887.00 |
| 2010.12.31 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>2010 නොවැම්බර් මස ජල බිල්පත පියවීම<br>පොදු වෙළඳසැල | 89 | 206607 | 15842.40 |
| 2010.12.17 | බී.ගුණරත්න<br>2010.12.01 දින සිට 2010.12.15 දින දක්වා නගරයේ කැලි කසල එකතු කිරීම හා ප්‍රවාහනය | 92 | 206612 | 95554.16 |
| 2010.12.22 | රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව<br>2010 වර්ෂය සඳහා කළමනාකරණ දිනපොත් මුද්‍රණය වෙනුවෙන් මුදල් ගෙවීම | 95 | 206648 | 18720.00 |
| 2010.12.22 | ස්වදේශ් ට්‍රේඩින් ඔටෝ විෂුවල් පුද්ගලික සමාගම<br>කාර්යාලය සඳහා ZMH4N ZOOM H4N හැන්ඩ්ල් වොයිස් රෙකෝඩර් එකක් ලබාගැනීම | 96 | 206649 | 33300.00 |
| 2010.12.22 | සාමාන්‍යාධිකාරී, ලංකා විදුලිබල මණ්ඩලය<br>පොදු වෙළඳසැලෙහි විදුලිය බිල්පත්හි හිඟ මුදල් ගෙවීම | 97 | 206650 | 40726.89 |
| 2010.12.22 | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය සිමෙන්ති මිටි 50 ලබාගැනීම | 98 | 208751 | 35500.00 |
| 2010.12.22 | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය සිමෙන්ති මිටි 50 ලබාගැනීම | 99 | 208751 | 35500.00 |
| 2010.12.22 | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය සිමෙන්ති මිටි 50 ලබාගැනීම | 100 | 208751 | 35500.00 |
| 2010.12.22 | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>2010.11.05 දින සිට 2010.11.12 දින දක්වා ඉන්ධන | 101 | 208752 | 77270.80 |

| | | | | |
|---|---|---|---|---|
| | බිල්පත පියවීම | | | |
| 2010.12.22 | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය 2010.11.15 දින සිට 2010.11.19 දින දක්වා ඉන්ධන බිල්පත පියවීම | 102 | 208752 | 46776.00 |
| 2010.12.22 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලි බල මණ්ඩලය 2010 දෙසැම්බර් මස විදුලිය බිල්පත පියවීම බැංකියවත්ත බැංකියවත්ත ii | 103 | 208753 | 17103.88 |
| 2010.12.22 | ආර්.ඩී.බී.එස්.ගුණසේකර තානායමේ පොල් අතු ගොඩනැගිල්ල සඳහා විදුලි පංකා ලබාගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම | 105 | 208754 | 18600.00 |
| 2010.12.22 | ඩබ්.එස්.පැකේජින් කාර්යාලයේ කටයුතු සඳහා භාවිතා කරන ලිපි ශිර්ෂ 5000 සභාපතිතුමාගේ ප්‍රයෝජනය සඳහා අවශ්‍ය ලිපි ශිර්ෂ 1000 හා අයවැය ලේඛනය සඳහා පිට කවර 50 මුද්‍රණය කිරීම | 106 | 208755 | 48361.50 |
| 2010.12.22 | හීරෝ ටෙක්ස් නගර සභාවේ සේවය කරන නිල ඇඳුම් හිමි පිරිසට නිල ඇඳුම් සඳහා රෙදි ලබාගැනීම | 107 | 208756 | 33264.00 |
| 2010.12.22 | ඩබ්.ඒ.එන්.සී.හාඩ්වෙයාර් සහ අයන් වර්ක්ස් බළන්ගොඩ තානායමේ ගේට්ටුව , ජනෙල් සඳහා ග්‍රිල් යෙදීම හා මෝටර් කාමර දොරවල සින්ක් එකට රාමුවක් සැකසීම වෙනුවෙන් වැඩ කුළිය ගෙවීම | 108 | 208758 | 66545.82 |
| 2010.12.22 | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ් 2010 නොවැම්බර් මස දුරකථන බිල්පත් පියවීම 2287275/2287153/2286592/2288737/E-Mail | 110 | 208759 | 18327.60 |
| 2010.12.22 | පී.ශෂිකුමාර් බළන්ගොඩ තානායමේ දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම කර්මාන්තයේ කොන්ක්‍රීට් වැඩ සඳහා වැඩ කුළිය ගෙවීම | 112 | 208761 | 57791.25 |
| 2010.12.22 | ඩබ්.ඒ.එන්.සී.හාඩ්වෙයාර් සහ අයන් වර්ක්ස් බළන්ගොඩ තානායමේ බෝගස අසල ගොඩනැගිල්ල ඉදිකිරීමට අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම | 113 | 208763 | 33164.50 |
| 2010.12.22 | සභාපති, තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය සුදර්ශනපුර නිවාස යෝජනා ක්‍රමය පාර පැති බැම්ම බැඳ සංවර්ධනය කිරීම ( මග නැගුම ) කර්මාන්තයේ 20% අත්තිකාරම් මුදල් ලබාදීම. | 114 | 208762 | 75000.00 |
| 2010.12.28 | එච්.එල්.පී.ටිම්බර් ඩීලර්ස් ඇන්ඩ් හාඩ්වෙයාර් ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය සිමෙන්ති මිටි 25 ලබාගැනීම | 115 | 208764 | 17500.00 |
| 2010.12.28 | 2010.11.25 දින සිට 2010.12.17 දින දක්වා 10000 වැඩි ගෙවීම් ( ලංකා බැංකුව ) | 04 | 000082 | 69347.04 |
| 2010.12.28 | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් 2010 ජුලි,අගෝස්තු,සැප්තැම්බර් මාසවල ජාතිය ගොඩනැගීමේ බදු මුදල දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත යැවීම | 05 | 000083 | 41680.00 |
| 2010.12.28 | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් 2010 iii කාර්තුවට අදාල වැට් බද්ද ( ලංකා බැංකු ගිණුම ) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත | 06 | 000084 | 600000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | යැවීම | | | |
| 2010.11.29 | කළමණාකරු, මහජන බැංකුව<br>බළන්ගොඩ-017-1-001-0-6351750 ගිණුමට බැර<br>ලංකා බැංකු ගිණුම සතු රු.600000 මුදල මහජන බැංකුවේ ගිණුම් අංක 017-1-001-0-6351750 ගිණුමට මුදල් මාරු කිරීම | 01 | 000085 | 10278.96 |
| 2010.12.01 | ශ්‍රී ලංකා නැෂනල් ආබිට්‍රේෂන් සෙන්ටර්<br>දේශීය ණය සංවර්ධන අරමුදල අතර බේරුම්කරණයේ 2010.10.18 , 2010.11.03 හා 2010.11.22 දිනවල බේරුම්කරණ මධ්‍යස්ථානයේ ගාස්තු ගෙවීම | 03 | 00087 | 2000000.00 |
| 2010.12.03 | කළමණාකරු, ලංකා බැංකුව , අංකඃ 0005947660 ගිණුමට බැර<br>මහජන බැංකුවේ ගිණුම් අංකඃ 017-1-001-0-6351750 ගිණුමට මුදල් මාරු කිරීම සඳහා ලංකා බැංකුවේ ගිණුම් අංකඃ 0005947660 ගිණුමට මුදල් බැර කිරීම | 04 | 000088 | 50999.20 |
| 2010.12.04 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>2010 ඔක්තෝබර් මස ජල බිල්පත පියවීම<br>නව බස්නැවතුම්පල | 05 | 000089 | 45091.80 |
| 2010.12.04 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලිබල මණ්ඩලය<br>2010 නොවැම්බර් මස විදුලිය බිල්පත පියවීම | 06 | 000090 | 700000.00 |
| 2010.12.13 | කළමණාකරු, මහජන බැංකුව,බළන්ගොඩ<br>017-1-001-0-6351750 ගිණුමට බැර<br>ලංකා බැංකු ගිණුමෙන් මහජන බැංකුවේ ගිණුම් අංකඃ 017-1-001-0-6351750 ගිණුමට මුදල් මාරු කිරීම | 07 | 000091 | 51617.20 |
| 2010.12.17 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>2010 නොවැම්බර් මස ජල බිල්පත පියවීම<br>නව බස්නැවතුම්පල | 08 | 000092 | 30000.00 |
| 2010.12.17 | ඩබ්.දයාරත්න<br>2010.10.18 දින පැවති බේරුම්කරණයේ වෘත්තීමය ගාස්තු ගෙවීම | 09 | 000092 | 30000.00 |
| 2010.12.17 | 2010.11.23 සිට 2010.12.22 දක්වා 10000/- වැඩි ගෙවීම් ( තානායම් ගිණුම ) | | | |
| 2010.11.23 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>2010 නොවැම්බර් මස ජල බිල්පත පියවීම ( තානායම) | 38 | 203272 | 15624.00 |
| 2010.11.23 | සාමාන්‍යාධිකාරී , ලංකා විදුලිබල මණ්ඩලය<br>2010 ඔක්තෝබර් මස විදුලිය බිල්පත පියවීම<br>තානායම/තානායම නිල නිවස | 39 | 203273 | 18574.96 |
| 2010.11.23 | ඒ.බී.මයුරි ලංකා පුද්ගලික සමාගම<br>තානායම මුළුතැන්ගෙය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 45 | 203278 | 20800.00 |
| 2010.11.26 | ඩිස්ටලරීස් කම්පැණි ඔෆ් ශ්‍රී ලංකා පී.එල්.සී<br>තානායම සඳහා අවශ්‍ය බීම වර්ග ලබාගැනීම | 51 | 203282 | 53323.24 |
| 2010.11.26 | රොක්ලන්ඩ් ඩිස්ටලරීස් පුද්ගලික සමාගම<br>තානායම සඳහා බීම වර්ග ලබාගැනීම | 52 | 203283 | 24623.10 |
| 2010.11.26 | රොක්ලන්ඩ් ඩිස්ටලරීස් පුද්ගලික සමාගම<br>තානායම සඳහා අවශ්‍ය බීම වර්ග ලබාගැනීම | 53 | 203283 | 10044.00 |

| | | | | |
|---|---|---|---|---|
| 2010.11.26 | රොක්ලන්ඩ් ඩිස්ටලරීස් පුද්ගලික සමාගම<br>තානායම සඳහා අවශ්‍ය බීම වර්ග ලබාගැනීම | 54 | 203283 | 20506.80 |
| 2010.11.26 | ටී.එම්.ඊ.දසා<br>තානායම සඳහා අවශ්‍ය කුකුල් මස් ලබා ගැනීම | 55 | 203284 | 28189.00 |
| 2010.11.26 | ටී.එම්.ඊ.දසා<br>තානායම සඳහා අවශ්‍ය කුකුල් මස් ලබා ගැනීම | 56 | 203284 | 19600.00 |
| 2010.11.26 | ඉන්දික එරික් සිසිල්<br>මොරටුවේ සිට බළන්ගොඩ තානායම දක්වා ගෘහ භාණ්ඩ ප්‍රවාහනය කිරීම වෙනුවෙන් ප්‍රවාහන ගාස්තු ගෙවීම | 57 | 203285 | 14000.00 |
| | 2010 දෙසැම්බර් මාසය | | | |
| 2010.12.02 | ඩිස්ටලරීස් කම්පැණි ඔෆ් ශ්‍රී ලංකා පී.එල්.සී<br>තානායම සඳහා අවශ්‍ය බීම වර්ග ලබාගැනීම | 14 | 203353 | 87084.21 |
| 2010.12.03 | ශ්‍රී ස්ටෝර්ස්<br>තානායම මුළුතැන්ගෙය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 23 | 203358 | 13742.00 |
| 2010.12.03 | ප්‍රියන්ත මුතුමාල<br>තානායම සඳහා අවශ්‍ය මාළු ලබාගැනීම | 27 | 203359 | 15220.35 |
| 2010.12.03 | පී.ආර්.එස්.පී.ජයරත්න<br>2010.10.17 සිට 2010.11.07 දක්වා තානායම සඳහා ආහාර ද්‍රව්‍ය ලබාගැනීම | 35 | 203360 | 14875.00 |
| 2010.12.03 | ප්‍රියන්වදා එන්ටර්ප්‍රයිසස්<br>තානායම සඳහා ගෑස් ලබාගැනීම | 42 | 203364 | 12296.00 |
| 2010.12.03 | ජේ.එන්.ඩිස්ට්‍රිබියුටර්ස්<br>තානායම සඳහා අවශ්‍ය බීම වර්ග ලබාගැනීම | 46 | 203366 | 24090.00 |
| 2010.12.03 | ටී.එම්.ඊ.දසා<br>තානායම සඳහා අවශ්‍ය කුකුල් මස් ලබා ගැනීම | 54 | 203374 | 22880.00 |
| 2010.12.03 | ජේ.එන්.ඩිස්ට්‍රිබියුටර්ස්<br>තානායම සඳහා අවශ්‍ය බීම වර්ග ලබාගැනීම | 59 | 203381 | 23716.00 |
| 2010.12.03 | එන්.අයි.ටී.ෆාම් ෂොප් තානායම සඳහා අවශ්‍ය කුකුල් මස් ලබා ගැනීම | 60 | 203383 | 18500.00 |
| 2010.12.16 | ස්ටේෂන් එක්ස්පෝස්ට්ස් ලිමිටඩ්<br>තානායම සඳහා චීස් වර්ග ලබාගැනීම | 64 | 203385 | 12955.56 |
| 2010.12.16 | ශ්‍රී ස්ටෝර්ස්<br>තානායම මුළුතැන්ගෙය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 65 | 203386 | 24480.72 |
| 2010.12.16 | ආර්.මයිල්වාහගම්<br>තානායම මුළුතැන්ගෙට අවශ්‍ය පවුඩර් වර්ග ලබාගැනීම | 66 | 203387 | 10925.00 |
| 2010.12.17 | පළාත් ආදායම් කොමසාරිස්<br>2010.08.28 සිට 2010.09.30 දක්වා තානායම් ගිණුමට අදාළ පිරිවැටුම් බදු පළාත් ආදායම් කොමසාරිස් වෙත යැවීම | 68 | 203389 | 18914.13 |
| 2010.12.17 | ඩිස්ටලරීස් කම්පැණි ඔෆ් ශ්‍රී ලංකා පී.එල්.සී<br>තානායම සඳහා අවශ්‍ය බීම වර්ග ලබාගැනීම | 69 | 203390 | 81813.38 |
| 2010.12.17 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලිබල මණ්ඩලය<br>2010 නොවැම්බර් මස විදුලිය බිල්පත පියවීම<br>තානායම/තානායම් නිල නිවස | 71 | 203392 | 21482.28 |
| 2010.12.17 | ශ්‍රී ලංකා ෆ්ලවරින් ට්‍රේඩින් කම්පැණි<br>තානායම සඳහා සෝස් වර්ග තෙල් වර්ග ලබාගැනීම | 72 | 203393 | 19240.00 |
| 2010.12.17 | ශ්‍රී ස්ටෝර්ස් | 83 | 203396 | 10800.00 |

| | | | | |
|---|---|---|---|---|
| | තානායම මුළුතැන්ගෙය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | | | |
| 2010.12.22 | ඩිස්ටලරීස් කම්පැණි ඔෆ් ශ්‍රී ලංකා පී.එල්.සී තානායම සඳහා අවශ්‍ය බීම වර්ග ලබැගැනීම | 93 | 210454 | 58278.24 |
| 2010.12.22 | එම්.ඒ.එම්.හනීෆා තානායම සඳහා අවශ්‍ය සහල් ලබාගැනීම | 95 | 210456 | 10750.00 |

මෙම මුදල් ගෙවීම් සියල්ල සභාව විසින් අනුමත කරන ලදී.

❖ 2010.12.28 දිනෙන් පසුව ගෙවීම් සිදුකිරීමට ඇති රු.10000/- ට වැඩි ගෙවීම්

| අනු අංකය | නම | විස්තරය | මුදල |
|---|---|---|---|
| 01 | ර/බළන්ගොඩ හින්දු විද්‍යාලය පාසල් සංවර්ධන සමිතිය | ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කසල මිළදී ගැනීමේ මධ්‍යස්ථාන ඉදිකිරීම | 349863.26 |
| 02 | ර/බළන්ගොඩ දෙමළ මහා විද්‍යාලය | ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කසල මිළදී ගැනීමේ මධ්‍යස්ථාන ඉදිකිරීම | 348538.62 |
| 03 | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ් | දුරකථනඅංකඃ 2287022/3452932/2287024 බිල්පත් පියවීම | 14149.18 |
| 04 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 2010 දෙසැම්බර් මස ජල බිල්පත පියවීම - කාර්යාලය | 20429.92 |
| 05 | කළමණාකරු, ශ්‍රී ලංකා රක්ෂණ සංසථාව | නගර සභාව සතු වාහන 2011 වර්ෂයට රක්ෂණය කිරීම | 308732.39 |
| 06 | ජේ.එෆ්.ඩිස්ට්‍රිබියුටර්ස් | සුදර්ශනගම ජල ව්‍යාපෘතියට ජලනල උපාංග ලබාගැනීම | 100238.99 |
| 07 | දිළුමිණ බිල්ඩර්ස් | හියුම් පයිප්ප ලබාගැනීම | 12000.00 |
| 08 | දේශානී හාඩ්වෙයාර් | ඉදිකිරීම් උපාංග | 10753.00 |
| 09 | ජේ.ජී.පී.වික්‍රමසිංහ | මහජන පුස්තකාලයට හා කියවීම් ශාලාවට නොවැම්බර් මස පුවත්පත් ලබාගැනීම | 15890.00 |
| 10 | එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම | 2011 වර්ෂයට මස්කඩ ටෙන්ඩර් කිරීම සම්බන්ධයෙන් පළකල පුවත්පත් දැන්වීම | 22131.20 |
| 11 | එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම | 2011 වර්ෂයට විවෘත කඩ අංකඃ 06 හා ත්‍රිරෝද රථ ඇතුළු රථවාහන නැවතුම් ගාස්තු අයකිරීමට ලංසු කැදවීම වෙනුවෙන් පළකල පුවත්පත් දැන්වීම | 15724.80 |
| 12 | එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම | 2011 වර්ෂයට පොදු වෙළඳසැල අංකඃ 17 මස්කඩය බඳුදීම සම්බන්ධ පුවත්පත් දැන්වීම | 20966.40 |
| 13 | එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම | 2011 වර්ෂයට බස්නැවතුම්පල වැසිකිළිය , මහජනපොළ , වැසිකිළිය නඩත්තුව සම්බන්ධ පුවත්පත් දැන්වීම | 23296.00 |
| 14 | එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම | කැළි කසල එකතු කිරීම හා ප්‍රවාහනය සම්බන්ධ පුවත්පත් දැන්වීම | 29120.00 |
| 15 | එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම | පොදු වෙළඳසැල අංකඃ 17 කුකුල් මස් | 10416.00 |

| | | | |
|---|---|---|---|
| | | කඩය බදුදීම සම්බන්ධ දෙමළ මාධ්‍ය පුවත්පත් දැන්වීම | |
| 16 | එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම | 2011 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචිය සම්බන්ධ දෙමළ මාධ්‍ය පුවත්පත්ත දැන්වීම | 23436.00 |
| 17 | කලර් හවුස් | තීන්ත ආලේපය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 18609.76 |
| 18 | ඒවිස් පෙරිපෙරල් ප්‍රයිවට් ලිමිටඩ් | කාර්යාලයේ භාවිතා කරන ප්‍රින්ටර් සඳහා රිබන් ලබාගැනීම | 21840.00 |
| 19 | ඩැක්ස් ඉංජිනියරින් ප්‍රයිවට් ලිමිටඩ් | බොබ් කැට් යන්ත්‍රය බකට් එක අලුත්වැඩියාව | 39604.12 |
| 20 | මොඩ් ස්පොට් ඉලෙක්ට්‍රොනික්ස් | DSC 5200 ඩිජිටල් කැමරා 03 ලබාගනීම | 37500.00 |
| 21 | කැළණි ඒජන්සීස් | ජල බවුසරය සඳහා අලුතින් ජල මෝටරයක් ලබාගැනීම | 65958.00 |
| 22 | සීගිරි ප්‍රින්ටර්ස් | ලිපි ද්‍රව්‍ය සකස් කිරීම | 20285.00 |
| 23 | සභාපති, තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය | තානායමේ ඉඩමේ වැට ඉදිකිරීම | 381649.27 |
| 24 | එල්.ඒ.සී.සී.මෙටල් ක්‍රෂර් | ගල් සැපයීම | 102000.00 |
| 25 | ජී.ඩබ්.ඉන්දුලාල් | වැලි සැපයීම | 49500.00 |
| 26 | රිෂානා සර්විස් ස්ටේෂන් | ජී.කේ.1483 ට්‍රැක්ටරය පූර්ණ සේවාව | 18088.00 |
| 27 | සිංගර් ශ්‍රී ලංකා පී.එල්.සී | තානායම සඳහා ඩයලොග් ඇන්ටනා හා ඩිකෝටර් එකක් ලබාගැනීම | 16999.00 |
| 28 | ජෝති ස්ටෝරස් | කාර්යාලීය අවශ්‍යතා | 27660.00 |
| 29 | ජෝති ස්ටෝර්ස් | කාර්යාලීය අවශ්‍යතා | 16525.00 |
| 30 | රසික ඇඩ්වටයිසින් | ජනාධිපතිතුමාගේ දෙවන පදවි ප්‍රාප්තිය වෙනුවෙන් බළන්ගොඩ නගරයේ ප්‍රදර්ශනය කිරීමට ඩිජිටල් බැනර් සකස් කිරීම | 13020.00 |
| 31 | එච්.එල්.පී.ටිම්බර් ඩීලර්ස් ඇන්ඩ් හාඩ්වෙයාර් | ඉදිකිරීම් උපාංග | 13930.00 |
| 32 | එච්.එල්.පී.ටිම්බර් ඩීලර්ස් ඇන්ඩ් හාඩ්වෙයාර් | ඉදිකිරීම් උපාංග | 11830.00 |
| 33 | සෙන්ට්‍රල් ඉන්ඩස්ට්‍රීස් | QL 2901 ත්‍රීරෝද රථය සේවා කිරීම හා අලුත්වැඩියාව | 10750.00 |
| 34 | ආදීපාද වීදිය විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂකගේ ගි.අ.1010008318 ට බැර | 2009 ජුලි, අගෝස්තු, සැප්තැම්බර් මාසික බිල්පත් පියවීම | 62540.10 |
| 35 | එච්.එල්.ඩබ්.ඉංජිනියරින් | 227-5020 ගලි බවුසරය අලුත්වැඩියාව සඳහා අමතර කොටස් ලබාගැනීම | 10270.00 |
| 36 | ක්.ඒ.අයි.නිශාන්ත | විදුලි උපාංග ලබාගැනීම | 12590.00 |
| 37 | ඊ.එම්.ජී.කරුණාරත්න | මහිමය ii සගරාවේ පිටපත් 100 මුද්‍රණය | 15000.00 |
| 38 | ඩබ්.ඒ.ඒ.එන්.හාඩ්වෙයාර් සහ අයන් වර්ක්ස් | කොම්පෝස්ට් පොහොර හලන යන්ත්‍රය අලුත්වැඩියාව | 21500.00 |
| 39 | නාගරික සංවර්ධනය පිළිබඳ ගි.අ.017-1-001-3-6352159 ගිණුමට බැර | 2009.01.01 සිට 2009.12.30 දින දක්වා පෙරසැරි ගාස්තු වශයෙන් තැන්පත් කරන ලද මුදල් 017-1-001-3-6352159 ගිණුමට බැර | 413544.00 |
| 40 | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ | 2010.10.16 දින සට 2010.10.31 දක්වා | 89305.60 |

| | | | |
|---|---|---|---|
| | සේවා සමුපකාර සමිතිය | ඉන්ධන බිල්පත් පියවීම | |
| 41 | සභාපති, පාසල් සංවර්ධන සමිතිය ( ර/ බළන්ගොඩ මධ්‍ය මහා විද්‍යාලය) | ප්‍රතිචක්‍රීයකරණය කළ හැකි කසළ මිළඳී ගැනීමේ මධ්‍යස්ථාන ඉදිකිරීම අවසන් ගෙවීම | 305256.96 |
| 42 | රෝයල් සෙරමික් | තානායමේ වැසිකිළියට ටයිල් හා කොමඩ් ලබා ගැනීම | 31543.92 |
| 43 | ආනන්ද හාඩ්වෙයාර් | බළන්ගොඩ තානායමේ නව දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් ඉදිකිරීම් උපාංග ලබාගැනීම | 285163.00 |
| 45 | පී.එල්.ෂමල් කුරේ | තානායමේ වැසිකිළිය ඉදිකිරීම වෙනුවෙන් ඉදිකිරීම් උපාංග ලබාගැනීම | 34041.15 |
| 46 | ර/කුමාර විද්‍යාලය ,පාසල් සංවර්ධන සමිතිය | ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කසළ මිළඳී ගැනීමේ මධ්‍යස්ථාන ඉදිකිරීම | 358569.02 |

මෙම මුදල් ගෙවීම් සියල්ල අනුමත කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙනලදී.

❖ බළන්ගොඩ නගර සභාවේ කරනු ලැබූ සංවර්ධන කාර්යයන් සඳහා විවිධ ආයතන වලින් භාණ්ඩ ලබාගැනීම සහ සේවා සපයාගැනීම වෙනුවෙන් ලැබී ඇති පහත සඳහන් බිල්පත් ගෙවීම සඳහා සභාවේ අනුමැතියට ඉදිරිපත් කර තිබුණි.

| අනු අංකය | ආයතනය | මුදල |
|---|---|---|
| 01 | හර්ෂණ කලර් සෙන්ටර් ( තීන්ත වර්ග | 16921.66 |
| 02 | හර්ෂණ කලර් සෙන්ටර් ( තීන්ත වර්ග ) | 34676.28 |
| 03 | ජී.ඩබ්.ඉන්දුලාල් ( වැලි කියුබ් 01 ) | 5500.00 |
| 04 | එච්.එල්.පී.ටිම්බර් ඩීලර්ස් ඇන්ඩ් හාඩ්වෙයාර් | 530.00 |
| 05 | සෙමිකාස් ට්‍රේඩ් සෙන්ටර් ( පොහොර සඳහා බෑග් ) | 9000.00 |
| 06 | සෙවන ග්ලාස් හවුස් | 2498.70 |
| 07 | එස්ලොන් ලංකා (පුද්)සමාගම | 15927.75 |
| 08 | එල්.එල්.පී.ටිම්බර් ඩීලර්ස් ඇන්ඩ් හාඩ්වෙයාර් | 320.00 |
| 09 | ආනන්ද හාඩ්වෙයාර් | 5500.00 |
| 10 | සිටි ටිම්බර් ඩිපෝට් (2x2 කම්බි ) | 2860.00 |
| 11 | සීගිරි ප්‍රින්ටර්ස් බලන්ගොඩ | 21100.00 |
| 12 | සෙරසිංහ ඔප්සෙට් ප්‍රින්ටර්ස් ( අයවැය - වාර්තාව ) | 25000.00 |
| 13 | සරණිපික්චර් පැලස් | 4120.00 |
| 14 | පෙරනිම් කොන්ක්‍රීට් කම්හල බලවින්න | 67846.00 |
| 15 | සෙවන ග්ලාස් හවුස් | 14585.00 |
| 16 | දේශානී හාඩ්වෙයාර් | 5434.00 |
| 17 | දිළුමිණ බිල්ඩර්ස් | 8800.00 |
| 18 | නිම්නා එන්ටර්ප්‍රයිසස් ඇන්ඩ් හාඩ්වෙයාර් ( සිමෙන්ති මිටි 50 ) | 36000.00 |
| 19 | චමින්ද ක්‍රියේෂන් | 42150 |
| 20 | රුෂිනි ෆර්නිචර්ස් | 389500.00 |
| 21 | ජී.ප්ලස් ( පුද්) සමාගම | 6188.00 |
| 22 | AIIC එන්ටර්ප්‍රයිසස් ( වැලි) | 42000.00 |
| 23 | AIIC එන්ටර්ප්‍රයිසස් ( වැලි) | 42000.00 |
| 24 | AIIC එන්ටර්ප්‍රයිසස් ( වැලි) | 18000.00 |
| 25 | දිමුතු පුත්‍රයෝ ( වැලි ) | 35000.00 |

මෙම මුදල් ගෙවීම් සියල්ල සභාව විසින් අනුමත කරන ලදී.

❖ **2010 වර්ෂයේ ගෙවීමට ඇති බිල්පත් - වාහන හා යන්ත්‍ර අලුත්වැඩියාව**

| දිනය | ආයතනය | විස්තරය | බිල් අංකය | මුදල |
|---|---|---|---|---|
| 2010.12.10 | මෙට්‍රොපොලිටන් ඔෆිස් පුද්.සමාගම | අළුත් ඡායා පිටපත් හා ෆැක්ස් යන්ත්‍රවල සේවා ගිවිසුම් ගාස්තු | 7338<br>7339 | 21280.00 |
| 2010.12.15 | ලේක් හවුස් ආයතනය | දිනමිණ තිනකරන් පුවත්පත් දැන්වීම් බිල්පත් | 8534<br>8097 | 23811.00 |
| 2010.11.26 | එස්.ඩබ්.එම්.එස්.පී.බණ්ඩාර | තත්ව වාර්තා ලබාගැනීම | - | 2000.00 |
| 2010.12.03 | Dax engineering | Fuel Solenoid | - | 66251.35 |
| 2010.12.10 | Dax engineering | Solid Tyre 04 | 546 | 439040.00 |
| 2010.11.08 | දේව් ට්‍රැක්ටර්ස් සමාගම | ජී.කේ.6227 ට්‍රැක්ටරයේ එන්ජිමේ අ.වැ. | 30076 | 202557.00 |
| | Dax engineering | බොබ් කැට් යන්ත්‍රයේ මී.පැය.3000 සේවා බිල්පත | | 102039.00 |
| 2010.10.19 | චමින්ද ඔටෝ | ජේ.සී.බී.කොයිල් එතීම | | 1650.00 |
| 2010.12.22 | සේරසිංහ ප්‍රින්ටර්ස් | ධාවන සටහන් කාඩ් | 16 | 1250.00 |
| 2010.12.06 | ජයන්ති ටයර් සෙන්ටර් | ඇම් පියර් 90 බැටරි 01 | | 13900.00 |

07. **ඇස්තමේන්තු අනුමත කිරීම**

පහත සඳහන් ඇස්තමේන්තු සභා අනුමැතිය ඉදිරිපත් කර තිබුණි.

07:01 වැලිහරනාව ජල ටැංකිය පාර කාණු ඉදිකිරීම රු.501606.72

07:02 මැද කිරිඳිගල මාර්ගය ( 5 අදියර ) බැම් බැද කාණු ඉදිකිරීම කර්මාන්තය රු.502503.36

07:03 මහමෙව්නා මාවත 3 වන පටුමග බැම් බැද කාණු ඉදිකර සංවර්ධනය කිරීම රු.500,422.41

07:04 හුණුකුඹුර ගාලෙවත්ත මාර්ගය බැම් බැද සංවර්ධනය කිරීම රු.509,421.30

07:05 සුදර්ශනපුර නිවාස යෝජනා ක්‍රම පාර බැම් බැද සංවර්ධනය කිරීම රු.502225.30

ඇස්තමේන්තු අනුමත කල සභාව , අංකඃ 07:01,07:02,07:03 යන කර්මාන්තයන් කිරිඳිගල ග්‍රාම සංවර්ධන සමිතිය වෙතත් අංකඃ 07:04 සිරි විජය ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ද, අංකඃ 07:05 තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය වෙතත් කොන්ත්‍රාත් ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

08. **යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ**

නැත

09. **ටෙන්ඩර් මිළ ගණන් සලකා බැලීම**

09:01 කොම්පෝස්ට් ව්‍යාපෘතියේ කටයුතු සඳහා ඉලෙක්ට්‍රොනික් තරාදි මිළදි ගැනීම

බලන්ගොඩ නගර සභාවේ කොම්පෝස්ට් ව්‍යාපෘතියේ කටයුතු සඳහා ඉලෙක්ට්‍රොනික් තරාදි මිළදි ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් පහත දැක්වේ.

| | W.M.International (Pvt) Ltd | Globel Master International | Kasunj enterprises Pvt Ltd |
|---|---|---|---|
| 150 kgx20/50 g කොරියාවේ නිෂ්පාදිත IP67 YS-Exl | 49,500/- | 56000/- | 68000/- |
| 300 kgx50 g නිෂ්පාදිත IP67 YS-Exal 300 | 53000/- | 68000/- | 70000/- |

ඉහත සඳහන් මිළ ගණන් අතුරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ඩබ්.එම්.ඉන්ටර්නැෂනල් ( පුද්) සමාගම වෙතින් අවශ්‍ය තරාදි මිළදි ගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

09:02 හුණුකුඹුර කෝපිවත්ත සුනිල් ගරාජය අසල මාර්ගය හා බෝම්බුව බෝධිමණ්ඩලාරාමය අසලින් නගර සභා නිවාස යෝජනා ක්‍රමයට යන පාර කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීමට හැකිවන අයුරින් බැම් බැඳීම

| විස්තරය | ඒ.කේ.ගුණසේන මයා, පීල්ලකුඹුර,මැද්දෙකන්ද බළන්ගොඩ | එන්.ආර්.දයානන්ද චන්ද්‍රසිරි මයා, පීල්ලකුඹුර,මැද්දෙකන්ද ,බළන්ගොඩ | යු.එන්.චමින්ද දිසානායක මයා, උඩවෙල, මොරහැල, බළන්ගොඩ | බී.එම්.ගුණවර්ධන මයා, උඩවෙල, මොරහැල, බළන්ගොඩ | ජී.ජී.සුගත් මයා , උඩවෙල, මොරහැල, බලන්ගොඩ. |
|---|---|---|---|---|---|
| සක්ක බැම් අඩි 01 | 32/- | 30/- | 33/- | 35/- | 38/- |
| කොන්ක්‍රීට් අඩි 01 | 32/- | 30/- | 33/- | 35/- | 38/- |
| කපරාරු අඩි 01 | 16/- | 12/- | 18/- | 19/- | 18/- |

අවම මිළ ඉදිරිපත් කර ඇති එන්.ආර්.දයානන්ද මහතාගේ මිළ ගණන පිළිගත් සභාව , අදාළ කාර්යය ඉටුකරගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

10. **යෝජනා: නැත**

11. **කාරක සභාවල වාර්තා සලකා බැලීම.**

11:01 2010.12.15 වන දින පැවති කර්මාන්ත කමිටු රැස්වීමේ වාර්තාව හා සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමණාකරණ කමිටු රැස්වීමේ වාර්තාව සභාගත කරන ලදි.

එම වාර්තාවන් සභාව විසින් අනුමත කරන ලදී.

12. **ආදායම් - වියදම් හා අනෙකුත් වාර්තා ඉදිරිපත් කිරීම:**

2010 වර්ෂයේ නොවැම්බර් මාසයට අදාළ ආදායම් හා වියදම් පිළිබඳ වාර්තාව සභාවට ඉදිරිපත් කර තිබුණි.

| | |
|---|---|
| පුනරාවර්ථන ලැබීම් | 3414765.17 |
| වෙනත් ලැබීම් | 727684.21 |
| **මුළු ලැබීම්** | **4142449.38** |
| පුනරාවර්ථන වියදම් | 3393216.25 |
| වෙනත් වියදම් | 4377693.62 |
| **මුළු වියදම්** | **7770909.87** |

මෙම ආදායම් හා වියදම් වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී.

12:02 2010.11.01 දින සිට 2010.11.30 දින දක්වා මෙම නගර සභාව සතු වාහන සඳහා වැය වු ඉන්ධන පිළිබඳ වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන ලදී. අදාළ ඉන්ධන වියදම් වාර්තාව අනුමත කරන ලදී.

12:03 බළන්ගොඩ නගර සභා තානායම සඳහා පනවා ඇති රෙගුලාසී මාලාව සභාවට ඉදිරිපත් කරන ලදුව එම රෙගුලාසී මාලාව සභාව විසින් අනුමත කරන ලදී.

13. **වෙනත් කරුණු :**

13:01 **ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා :**

අද දින පවත්වනු ලබන්සේ වර්ෂ අවසාන සභා රැස්වීම යැයි පැවසු ගරු මන්ත්‍රීතුමා , වසර 05 ක කාලයක් මෙම සභාවේ ගරු මන්ත්‍රීවරුන් වාද විවාද වාග් ප්‍රහාර මධ්‍යයේ ඉතා සාර්ථකව සහයෝගීව මහජන සේවාවන් රැසක් ඉටුකල බැව් සතුටින් යුතුව පවසන බව දැන්වීය.

සභා මුදල් වලට අමතර ජාතික සවිය , ගම නැගුම හා මග නැගුම ව්‍යාපෘති හරහා ද ජනතා අවශ්‍යතාවන් හඳුනාගෙන ජනතා සිතුම් පැතුම් ඉටුකිරීමට ක්‍රියාකල මන්ත්‍රීවරුන් කණ්ඩායමක් ලෙස වර්තමාන පාලක පක්ෂය හැඳින්විය හැකි බැව් දැන්වීය. ඉදිරියේ දී පළාත් පාලන මැතිවරණයක් පැවැත්වීමට අපේක්ෂිත වන අතර , එය පැවැත්වෙන කාල වාකවානු සම්බන්ධව අදහස් ප්‍රකාශ කිරීමට නොහැකි බවත් , එය කෙසේ වෙතත් මහජන සේවාවන් ඉටුකල කණ්ඩායමක් ලෙස ජනතාව අතරට යෑමට ගරු මන්ත්‍රීවරුන්ට හැකියාව තිබෙන බැව් දැන්වීය.

මෙම සභාවේ ගරු මන්ත්‍රීවරුන් කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කරන නිසා සභාවේ ගෞරවය ආරක්ෂා කරමින් මහජන සේවාවන් ඉටුකිරීමට ක්‍රියාකර ඇති බවත් , නමුත් දිවයිනේ ඇතැම් පළාත් පාලන ආයතන වල පවතින අර්බුද හේතුවෙන් 2011 වර්ෂයේ අයවැය පරාජයට පත්ව ඇති බැව් පැවසීය.

වැඩිදුරටත් අදහස් දැක් වු එතුමා , බළන්ගොඩ ප්‍රදේශය ඉතා ශ්‍රේෂ්ඨ පින්බර ප්‍රදේශයක් වන බැව් සඳහන් කල අතර , ලෝකයේ ප්‍රථම අග්‍රාමාත්‍යවරිය වු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය , අතිගරු අග්ගමහා පණ්ඩිත බළන්ගොඩ ආනන්ද මෛත්‍රීය මහා නායක ස්වාමීන් වහන්සේ වැනි ලොව සුපතල විද්වතුන් බිහි වු පුන්‍යවන්ත ප්‍රදේශයක් ලෙස හැඳින්විය හැකි බැව් පැවසීය. මෙම පුන්‍යවන්ත ප්‍රදේශය මේවන විට සීඝ්‍ර දියුණුවකට ලක්ව ඇති අතර , එම සංවර්ධන ක්‍රියාවලියට මෙම ප්‍රදේශය පාලනය කල ආසන සංවිධායකවරුන් සහ නගරයේ දියුණුව අපේක්ෂා කරන ගරු මන්ත්‍රීවරුන් සහයෝගය ලබා දී ඇති බැව් ස්තුතිපුර්වකව දන්වන බව පැවසීය.

දිවයිනේ සෙසු නගර හා සසදා බලන කල බළන්ගොඩ නගරය නුගේගොඩින් මෙහා තිබෙන හොඳම නගරය ලෙස හැඳින්විය හැකි අතර , නගරයට අවශ්‍ය අංගයන් සියල්ල සම්පූර්ණ කර ඇති බවත් , මේ වන විට බළන්ගොඩ මහජනපොල ඉදිකිරීමේ කාර්යය ද අවසන් වී ඇති අතර , නගරයට තව අත්‍යාවශ්‍ය වී ඇත්තේ ක්‍රීඩාපිටියක් සකස් කිරීම වන බැවින් , අපගේ පාලන කාලය තුළ එය ඉදිකිරීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීමට ශක්ති ධෛර්ය හා වාසනාව උදා වේවායි සුභාශිංසනය කරන බව ද දැන්වීය.

2011 වර්ෂයේ අයවැය මගින් සංවර්ධන කටයුතු සඳහා ගරු මන්ත්‍රීවරුන්ට රු.ලක්ෂය බැගින් මුදල් ප්‍රතිපාදන වෙන්කර ඇති නිසා එම මුදල් ප්‍රතිපාදන වලින් උඩඇල්ලෙපොල ප්‍රේමරත්න මහතාගේ නිවස අසල කාණුව සකස් කරන ලෙස ඉල්ලා සිටින ලදී.

බළන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට අනුයුක්තව බළන්ගොඩ නගරසභා බලප්‍රදේශයට අයත්වන ප්‍රදේශවල සේවය කරන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීම උදෙසා නගර සභාව විසින් බලය පැවරීමක් සිදුකර ඇති බැව් පැවසීය., පසුගිය දා එම නිලධාරීන්ගෙන් කිහිප දෙනෙකු බළන්ගොඩ නගරයේ වෙළඳසැල් පරීක්ෂාවට ලක්කරන ලදී. එහි දී ඔවුන් වෙළඳසැල් වල කටයුතු සම්බන්ධව චෝදනාත්මක ස්වරූපයෙන් අදහස් ප්‍රකාශ කරනු ලැබූ අතර , ඇතැම් වෙළඳසැල් හිමියන්ට විශාල පාඩු සිදුවන ආකාරයට කටයුතු කර ඇති බැව් පැවසීය. මේ සම්බන්ධව සිය කණගාටුව ප්‍රකාශ කරන අතර , බලය ලබා දී ඇත්තේ ජනතාවට සේවය කිරීමට මිස ජනතාව පීඩනයට ලක්කිරීමට නොවන බැව් සඳහන් කල අතර, බලය පැවරුවාට එය අනිස ලෙස පාවිච්චි කිරීමට ඉඩනොදිය යුතු බැව් අවධාරණය කරන ලදී.

ඉදිරියේ දී පැවැත්වීමට අපේක්ෂිත පළාත් පාලන මැතිවරණයේ මෙම සභාවේ සියළුම ගරු මන්ත්‍රීවරුන්ට ජයග්‍රහණය කිරීමට වාසනාව උදාවේවා යි සුභ ප්‍රාර්ථනා කරන අතර , ලබන්නා වූ 2011 වසර සමෘද්ධිමත් නව වසරක් වේවා යි පවසමින් සිය කථාව නිමකරන ලදී.

13:02 **ගරු නාගරික මන්ත්‍රී , යූ.එච්.ගාමිණී මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමා කථාකරමින්, බළන්ගොඩ මහජනපොළ ටෙන්ඩර් කිරීම මගින් සභාවට විශාල ආදායමක් ලැබෙන බැව් පෙන්වා දෙන ලදී.

එම නිසා කඩ කාමර ටෙන්ඩර් කරන ලෙසත් , එසේ නොකර බදුදෙන්නේ නම් ඒ සම්බන්ධව සිය විරෝධතාවය ප්‍රකාශ කරන බවත් දැන්වීය.

13:03 **ගරු නාගරික මන්ත්‍රී, ඩබ්.විමලසේන මැතිතුමා**

බළන්ගොඩ මහජනපොළේ ඉදිරිපෙළ කඩ කාමර ටෙන්ඩර් කිරීම සුදුසු බවත් , අනෙකුත් කඩ කාමර දිර්ඝ කාලයක් පොලේ වෙළඳාම් කල අයට පවරාදීම සුදුසු යැයි පැවසීය. ( ගරු සභාපතිතුමා කථාකරමින් , යම් කිසි තීන්දුවක් සභා සම්මත වන්නේ බහුතර මන්ත්‍රීවරුන්ගේ එකඟතාවයෙන් වන අතර මීට අදාළව තීන්දුවක් ගෙන ඇති නිසා තීන්දු වෙනස් කිරීමට හැකියාවක් නොමැති බැව් පැහැදිලි කරන ලදී. )

13:04 **ගරු නාගරික මන්ත්‍රී , එම්.ටී.එම්.රූමි මැතිතුමා :**

ගරු මන්ත්‍රීතුමා කථා කරමින් , එක්සත් ජනතා නිදහස් සංධානයේ නාගරික මන්ත්‍රීවරයෙකු ලෙස වසර 04 ක කාලයක් සේවය කිරීමට ලැබීම සම්බන්ධව සිය සතුට පළකරන බැව් පැවසූ ගරු මන්ත්‍රීතුමා , අතිගරු ජනාධිපතිතුමන් තවත් වසරකින් පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින්ගේ ධුර කාලය දිර්ඝ කිරීමෙන් තවත් වසරක කාලයක් ජනතාව වෙනුවෙන් සේවය කිරීමට අවස්ථාව ලැබුණු බවත් , එම නිසා වර්තමාන පළාත් පාලන

ආයතනවල මහජන නියෝජිතයින් කණ්ඩායම ඉතාමත් වාසනාවන්ත පිරිසක් ලෙස හැඳින්විය හැකි බව වැඩිදුරටත් පවසන ලදී. එසේම ඉතිහාසයේ ප්‍රථම වතාවට බළන්ගොඩ නගර සභාවට එක්සත් ජනතා නිදහස් සංධානයෙන් සුළු ජාතීන් නියෝජනය කරමින් නාගරික මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත්වීමට හැකිවීම තමා ලද භාග්‍යයක් යැයි පැවසීය.

දේශපාලනයට නවකයෙකු ලෙස 2005 වර්ෂයේ පැවති පළාත් පාලන මැතිවරණයට ඉදිරිපත්ව , ජයග්‍රහණය කල බැව් පැවසීය. එවකට එක්සත් ජාතික පක්ෂය මෙම සභාව පාලනය කල අතර , එම පක්ෂයේ පැවති අඩුපාඩු හා මන්දගාමී ක්‍රියාකලාපය නිසා 2005 වර්ෂයේ දී පැවති පළාත් පාලන මැතිවරණයේ දී එක්සත් ජනතා නිදහස් සංධානයට අතිවිශිෂ්ඨ ජයග්‍රහණයක් ලැබු බැව් පැවසීය. එම මැතිවරණ ව්‍යාපාර කටයුතු වලට වත්මන් ගරු සභාපතිතුමා විශේෂ නායකත්වයක් ලබාදුන් අතර , ප්‍රදේශයේ ජනතාව ජාති ආගම් කුලභේදයෙන් තොරව ඡන්දය ලබා දී එක්සත් ජනතා නිදහස් සංධානය ජයග්‍රහණය කිරීමට දායක වු බව පැවසීය. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම සභාවට දක්ෂ මන්ත්‍රීවරුන් කණ්ඩායමක් සහ ඉතාමත් කැපවීමෙන් , උනන්දුවෙන් යුතුව කටයුතු කරන දක්ෂ සභාපතිවරයෙකු තේරීපත්වුන බැව් පැවසීය. සභාවේ කටයුතු සාර්ථකව පවත්වාගෙන යාමට දක්ෂ ලේකම්වරයෙකු හා දක්ෂ කාර්ය මණ්ඩලයක් පත්ව සිටින නිසා ඔවුන්ගේ සහයෝගය හා කැපවීම මත බළන්ගොඩ ප්‍රදේශය සිඝ්‍ර දියුණුවකට ලක්කිරීමට වත්මන් පාලක පක්ෂය හැකි වු බැව් පැවසීය. බළන්ගොඩ නගරයට අඩුපාඩුවක්ව ඇති බස්නැවතුම්පල,මහජනපොල හා වෙළඳ සංකීර්ණය සකස් කර ඇති අතර , තව ඇත්තේ මහජන ක්‍රීඩාංගණය සකස් කිරීම පමණක් යැයි පැවසු එතුමා ඉදිරි පළාත් පාලන මැතිවරණයට පෙර ක්‍රීඩාපිටියට මුල්ගල තැබීමට අවශ්‍ය පසුබිම සකස් කරන ලෙස ඉල්ලා සිටින ලදී.

2011 වර්ෂයේ අයවැය මගින් ගරු මන්ත්‍රීවරුන්ට සංවර්ධන කටයුතු වෙනුවෙන් රු.ලක්ෂය බැගින් ලබාදීමට මුල්‍ය ප්‍රතිපාදන වෙන්කර ඇති නිසා එම මුදල 2011 ජනවාරි මාසයේ මුදල් සතිය තුළ ජනතාව වෙනුවෙන් සේවය කිරීම සඳහා ලබාදෙන ලෙස ද ඉල්ලීමක් කරන ලදී.

තව දුරටත් කථා කල ගරු මන්ත්‍රීතුමා , මහජනතාව වෙනුවෙන් සේවය කිරීමේ දී යම් යම් කාරණා සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන් සමඟ ගරු සභාපතිතුමා සමඟ වාද විවාද ඇතිකරගත් අවස්ථා තිබුණු බවත් , නමුත් ඒවා එම අවස්ථාවට පමණක් සීමාවු අතර , පසුව සහෝදර මන්ත්‍රීවරුන් කණ්ඩායමක් ලෙස සභාවේ ගෞරවය ආරක්ෂා වන ආකාරයට කටයුතු කිරීමට මෙම සභාවේ ගරු මන්ත්‍රීවරුන් ක්‍රියාකල බැව් පැවසීය.

ඉදිරි පළාත් පාලන මැතිවරණයේ දී මෙම සභාවේ ගරු සභාපතිතුමා ප්‍රමුඛ ගරු මන්ත්‍රීවරුන් සියළු දෙනාටම නැවත මෙම සභාවට තේරී පත්ව ජනතාවට සේවය කිරීමට වාසනාව උදාවේවා යි සුභාශිංශනය කරමින් , ලබන්නා වු 2011 වසරට සුභ පැතුම් ද එක්කරමින් සිය අදහස් දැක්වීම නිම කරන ලදී.

## 13:05 **ගරු නාගරික මන්ත්‍රී , ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමා කථාකරමින්, පසුගිය වසර 05 ක කාලය අතිතාවර්ජනය කිරීමේ දී බළන්ගොඩ නගර සභාව සුවිශේෂි වු මෙහෙවරක් ජනතාව වෙනුවෙන් ඉටුකල ආයතනයක් ලෙස හැඳින්විය හැකි බැව් පැවසීය. දිවයිනේ සෙසු පළාත් පාලන ආයතන වලට ආදර්ශයක් වෙමින් , සම්මානයට , ගෞරවයට පත්වු මෙම ආයතනය , මැති ඇමතිවරුන් විසින් විදේශ රටවලදී ද ඇගයීමට ලක්කර ඇති බැව් පැවසීය. ඒ සම්න්ධව අප සියළු දෙනාටම සතුටුවිය හැකි බව පැවසු ගරු මන්ත්‍රීතුමා , මෙම සභාවේ ගරු මන්ත්‍රීවරුන් මහජනතාව වෙනුවෙන් යුතුකම් ඉටුකර ඇති පිරිසක් යැයි පැවසීය. දිවයිනේ අනෙකුත් පළාත් පාලන ආයතන අතුරින් වැඩි ප්‍රමාණයක මහජන නියෝජිතයින් විවිධ මතභේද ඇතිකරගනිමින් සභාවේ කටයුතු අකර්මර්නය කිරීමට ක්‍රියාකාර ඇති බැව් පැවසීය. නමුත් මෙම සභාවේ ගරු මන්ත්‍රීවරුන් ඒ ආකාරයට කටයුතු කර නොමැති බවත් , ඇතැම් අවස්ථාවලදී වාද විවාද සිදුකරනු ලැබුවද එය මහජන සේවය වඩාත් ඵලදායීව ඉටුකිරීමට විනා ද්වේශසහගත ලෙස කටයුතු කිරීමක් නොවන බැව්

අවධාරණය කල අතර , කණ්ඩායමක් ලෙස සහයෝගීව කටයුතු කිරීමට මෙම සභාවේ ගරු මන්ත්‍රීවරුන් ක්‍රියාකල බැවින් , ඒ සම්බන්ධව අප සියළු දෙනාටම සතුටුවිය හැකි බැව් පැවසීය.

2011 වර්ෂයේ අයවැයෙහි ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කර ඇති ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි " නගර සභාව මගින් අයවැය ප්‍රතිපාදන මත එක් මන්ත්‍රීවරයෙකුට ලක්ෂ 50 කට ආසන්න මුදලක් වැයකරමින් සංවර්ධනය කාර්යය ප්‍රමාණයක් ඉටුකර ඇති බැව් සදහන් කර ඇත." ප්‍රදේශයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් සභා මුදල් වැයකරනු ලැබුවේ ඉතාමත් සුළුවශයෙන් වන අතර , අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන වැඩ සටහන යටතේ ජාතික සවිය , ගම නැගුම , මග නැගුම වැනි ව්‍යාපෘති තුලින් වෙන් මුදල් මුදල් ප්‍රදේශයේ සංවර්ධනය සදහා යොදවන ලද බැව් පැවසීය. එසේම එම අයවැය ලේඛනයේ ශිෂ්‍යත්ව ආධාර ලබාදීම, වැසිකිලි ආධාර ලබාදීම වැනි සුභසාධක සේවාවන් සඳහා මුදල් ප්‍රතිපාදන වෙන්කර ඇති ඇති බැව් සදහන්ව ඇත. එසේ සදහන් වුවත් , 2009 වර්ෂයේ දී වැසිකිළි ආධාර ලබාදුන්නා පසුව මේ දක්වා එම ආධාර ලබානොදුන් බැව් පැවසීය.මෙම නගර සභාව විසින් පසුගිය දා ගුරු උපහාර උළෙලක් පැවැත් වූ අතර , එම උපහාර උලෙලට සහභාගී වූ ගුරු මහතා ලවා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සිදුකල බවත් , නාගරික ජනතාවගේ මුදල් වලින් ලබාදෙනු ලබන ශිෂ්‍යාධාර මුදල් වෙනත් අයෙකු ලවා පිරිනැමීමෙන් එහි ගෞරවය හා කීර්තිය ලැබුනේ ඒ මහතාට යැයි පැවසීය. මෙවැනි කාරණා සම්බන්ධව සතුට පළකල නොහැකි බවත්, මෙහි ගෞරවය හිමිවිය යුත්තේ නාගරික ජනතාවට සහ නගර සභාවට යැයි පැවසීය. වැසිකිලි ආධාර කලට වේලාට ලබානොදීමෙන් වතු ආශ්‍රිත වැසිකිලි නොමැති ජනතාව විවිධ ලෙඩ රෝග වලට ලක් වූ අතර ජීවිත හානි සිදු වූ අවස්ථා ද තිබුණ බැව් දැන්වීය. සභාවේ කටයුතු සම්බන්ධව ජනතාව නිරන්තරව අවදියෙන් සිටින අතර , මහජන සුබවිහරණය උදෙසා ක්‍රියාත්මක කරනු ලබන වැඩ සටහන් කලට වේලාවට ක්‍රියාත්මක නොවීමෙන් ජනතාව ගරු මන්ත්‍රීවරුන්ට දෝෂාරෝපණය කරන බවත් , සභාව කෙරෙහි අප්‍රසාදයක් ඇතිකර ගන්නා බවත් පැවසීය. එසේම , මහජනපොළේ කඩ කාමර බදුලබාදීමේ පදනම සම්බන්ධව තමා සෑහීමකට පත්නොවන බවත් , පොලේ වෙළඳාම් කරනු ලබන්නේ ආර්ථික අපහසුතා මධ්‍යයේ ජීවත්වන පිරිසක් යැයි පැවසූ එතුමා , මෙම අය අතුරින් ඉතාමත් ආර්ථික වශයෙන් අසරණව සිටින අයවලුන් 10 තෝරා ඔවුන්ට අඩුම වශයෙන් කඩ කාමර 10 ක් ලබාදීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

තමා මෙම සභාවේ මන්ත්‍රීවරයෙකු ලෙස සේවය කල කාලය තුළ මෙම සභාවෙන් කිසිදු ආකාරයක ලාභ ප්‍රයෝජනයක් තමා හෝ තම ඥාතියෙකුට ලබාගෙන නොමැති බවත්, තමා පෞද්ගලික සමාගමක සේවය කරමින් ජීවත්වූ බවත් සදහන්කරන ලදී.

ඉදිරි පළාත් පාලන මැතිවරණයේ දී සියළු දෙනාටම ජයග්‍රහණය කිරීමට වාසනාව උදෙසා වේවා යි සුභ ප්‍රාර්ථනය කරමින් සිය අදහස් දැක්වීම නිම කරන ලදී.

13:06 **ගරු නාගරික මන්ත්‍රී , ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමා කථා කරමින් , 1991 වර්ෂයේ සිට තමා මෙම නගර සභාවේ පාලන පක්ෂයේ හා විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු ලෙස මහජනතාව වෙනුවෙන් උපරිම සේවයක් ඉටුකල බැව් පැවසීය. එදා සිට මේ දක්වා මෙම සභාවේ කිසිදු මන්ත්‍රීවරයෙකු නිලධාරියෙකු සමග ගැටීමකින් තොරව ඉතාමත් සුහවද සේවය කල බැව් පැවසීය. ඒ සම්බන්ධව ගරු සභාපතිතුමා ප්‍රමුඛ ගරු මන්ත්‍රීතුමන්ලාටත් , ලේකම්තුමා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයටත් ස්තුතිය පළකරන බැව් දැන්විය. සිය දේශපාලනය කටයුතු වලට හිටපු ගරු ආණ්ඩුකාරවර මොහාන් සාලිය එල්ලාවල මැතිතුමාගෙන් ලැබුණු උපදෙස් හා මග පෙන්වීම හා සහයෝගය ඉතාමත් කෘතවේදීව මෙම අවස්ථාවේ දී සිහිපත් කරන බවද සදහන් කරන ලදී.

මෙම නගර සභාව මෙම වර්ෂ 05 තුළ විශාල වැඩ කොටසක් ඉටුකර ඇති අතර , මග නැගුම මග නැගුම වැනි වැඩසටහන් හරහා ද විශාල සංවර්ධනයක් සිදුකර ඇති බැවින් , ගරු මන්ත්‍රීවරුන්ට අභිමානයෙන් ජනතාව අතරට යෑමට හැකිව තිබෙන බැව් දැන්වීය. එම නිසා ඉදිරි පළාත් පාලන මැතිවරණයේ දී බළන්ගොඩ නගර සභාව එක්සත් ජනතා නිදහස් සංධානය

අතිවිශිෂ්ඨ ලෙස ජයග්‍රහණය කරන බැව් දැන්වීය. බළන්ගොඩ නගරයට අත්‍යාවශ්‍ය වූ අංග සියල්ලක්ම සම්පූර්ණ කර ඇති අතර , තව ඇත්තේ ක්‍රීඩාපිටිය සකස් කිරීමට පමණක් යැයි

අවධාරණය කරන ලදී. එය සකස් කිරීමට ද සභාවේ අවධානය යොමු වී ඇති අතර , බළන්ගොඩ මහජන පොළ ඉදිකර අවසන්ව ඇති නිසා , එය ජනතා අයිතියට පැවරීමෙන් පසුව ක්‍රමවත්ව රථවාහන සැලැස්මකට අනුව රථවාහන ධාවනය කරවීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කරන ලෙස ඉල්ලා සිටින ලදී.

මහජනතාව වෙනුවෙන් උපරිම සේවයක් සැලසීමට කටයුතු කල ගරු සභාපතිතුමා,ගරු මන්ත්‍රීවරුන් , ලේකම්තුමා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයට සිය කෘතවේදිතාව පළකරමින් ලබන්නා වූ 2011 වසර සැමට සාමය සතුට පිරි සුභ නව වසරක් වේවා යි ප්‍රාර්ථනය කරමින් සිය කථාව නිම කරන ලදී.

14. **අවසානය:**

**ගරු සභාපති,ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා :**

ගරු සභාපතිතුමා කථා කරමින් , 2010 වර්ෂයේ අවසාන සභා රැස්වීමට සහභාගී වී සභාවේ කටයුතු සාර්ථක කරගැනීමට සහයෝගය ලබාදුන් ගරු මන්ත්‍රීතුමන්ලාටත් , ලේකම්තුමා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයටත් සිය ස්තුතිය පිරිනමන බැව් දැන්වීය.

අයවැය ලේඛනය මගින් වාර්ෂිකව සුභ සාධන සේවාවන් සඳහා මුදල් ප්‍රතිපාදන වෙන්කර අදාළ සේවාවන් ලබාදීමට කටයුතු කරනු ලබනු ලබන බව පැවසීය. ඒ යටතේ වාර්ෂිකව වැසිකිලි ආධාර ලබාදීම සඳහා ද මුදල් වෙන්කර එම ආධාර ලබාදීමට කටයුතු කල බවත් , නමුත් මෙවර ඒ සඳහා අනුමැතිය ලබාගැනීම ප්‍රමාදවීම නිසා එම ආධාර ලබාදීම මදක් ප්‍රමාද වූ බැව් පැවසීය. එසේ වුවද ඊයේ දිනයේ දී ඒ සඳහා අනුමැතිය ලැබුණු බැවින් , හෙට දිනයේ ප.ව.03.00 ට ඒ සඳහා චෙක්පත් ප්‍රදානය කිරීමට අවශ්‍ය කටයුතු සලසා ඇති බැව් පැවසීය.

බළන්ගොඩ නගර සභා බලප්‍රදේශයට විශාල අඩුවක්ව පැවති බස්නැවතුම්පල හා වෙළඳ සංකීර්ණය , මහජනපොල ඉදිකිරීම අවසන් කර ඇති අතර , ක්‍රීඩාපිටිය සකස් කිරීමට පමණක් ඉතිරිව ඇති අතර , එය සකස් කිරීමට විශේෂ අවධානයක් යොමුව ඇති බැව් පැවසූ ගරු සභාපතිතුමා , මැතිවරණයේ දී ජනතාව වෙත ලබාදුන් මැතිවරණ පොරොන්දු ඉටුකරමින් , අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන වැඩ පිළිවෙල අර්ථවත් කරමින් මග නැගුම ගමනැගුම ව්‍යාපෘති හරහා ලැබුණු මුදල් සහ සභා මුදල් ද ඇතුළුත්ව එක් ගරු නාගරික මන්ත්‍රීවරයෙකුට රු.ලක්ෂ 50 කට ආසන්න මුදලක් වැයකරමින් බළන්ගොඩ නගරසභා බල ප්‍රදේශය තුළ විශාල සංවර්ධන කාර්යයන් රැසක් ඉටුකර ඇති බැව් පැවසීය. එම නිසා ,මෙම සභාවේ සියළුම ගරු මන්ත්‍රීවරුන්ට ගරු ගාම්භීරව අභිමානයෙන් යුතුව ජනතාව ඉදිරියට යාමට හැකිවන පසුබිම නිර්මාණය කර ඇති බැව් පැවසීය.

නගර සභාවෙන් ජනතාවට ඉටුවිය යුතු වූ සේවාවන් ඉටුකිරීම උදෙසා තමා ඉතාමත් කැපවීමෙන් යුතුව කටයුතු කල අතර , පක්ෂයේ අභිවෘද්ධිය උදෙසා ද ඒ ආකාරයටම කැපවීමෙන් කටයුතු කල බැව් පැහැදිලි කරන ලදී. දේශපාලන කටයුතු ඉටුකිරීමට යාමේ දී ඇති වූ සිද්ධියකට එක් අවස්ථාවක දී මාස ගණනාවක් තමා හට බන්ධනාගාරගත වීමට ද සිදුවූ බැව් ද පැහැදිලි කරන ලදී. ඇතැම් අයට මේවා විඳදරා ගැනීමට නොහැකිව විවිධ ප්‍රකාශයන් සිදුකරනු ලබන බව පැවසීය. ඒ කෙසේ වුවත් ජනතාව වෙනුවෙන් සහ පක්ෂය වෙනුවෙන් සුවිශාල මෙහෙයක් ඉටුකර ඇති නිසා ඒ සම්බන්ධව තමාට අවංකවම සතුටුවිය හැකි බැවින් , තමා වෙත එල්ලකරනු ලබන චෝදනා සම්බන්ධව තමා කම්පාවට පත්නොවන බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

මෙවැනි සුවිශාල වු මෙහෙවරක් නාගරික ජනතාව වෙත ලබාදීමට මෙම සභාවේ ගරු මන්ත්‍රීවරුන් ,ලේකම්තුමා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයෙන් විශාල සහයෝගයක් ලැබුණු බව ඉතාමත් කෘතවේදීව සිහිපත් කරන අතර , ඒ සම්බන්ධව සියළු දෙනාටම සිය ස්තුතිය පළකරන බව දන්වන ලදී.

ඉදිරියේ දී පළාත් පාලන මැතිවරණයක් පැවැත්වීමට අපේක්ෂිත වන අතර , එම මැතිවරණයේ දී මෙම සභාවේ ගරු මන්ත්‍රීවරුන් සියළු දෙනාටම ජයග්‍රහණය කිරීමට හැකියාවේවා යි සුභ ප්‍රාර්ථනය කරමින් ලබන්නා වු 2011 වසර සැම දෙනාටම සුභ නව වසරක් සහ සුභ අනාගතයක් වේවා යි පවසමින් සභාවේ වැඩ කටයුතු ප.ව.2.00 ට පමණ අවසන් කරන ලදී.

ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.